## වැලිමඩ ප්‍රාදේශීය සභාවේ මහ සභා රැස්වීම් වාර්තාව - 2025.10.30

**පිළිගැනීම**

2025 වර්ෂයේ ඔක්තෝම්බර් මස 30 වන බ්‍රහස්ප්‍රතින්දා දින පෙ.ව.09.00 ට මූලාසනය දැරූ ගරු සභාපතිතුමා විසින් ගරු උප සභාපතිතුමා, ගරු මන්ත්‍රී මණ්ඩලය , සභා ලේකම්තුමා , කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදී මහතුන් ඇතුළු සියළු දෙනා පිළිගැනීමෙන් අනතුරුව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි.

**පැමිණීම**

**සහභාගි වූ ගරු මන්ත්‍රීවරුන්ගේ නාම ලේඛනය**

1. ගරු සභාපති ඩී.එම්. අජිත් කුමාර මැතිතුමා
2. ගරු උපසභාපති එම්.එල්.එම්. සෆ්වාන් මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්.ඉන්දික සම්පත් මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.දයාරත්න මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එම්.ප්‍රභාත් රවීන්ද්‍ර ගුණසේකර මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.කරුණාරත්න මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.වී.එන්.කුසුම් කුමාරි මැතිණිය
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහොමඩ් හලීම් මොහොමඩ් ෆායිස් සයිබු මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.අජිත් ප්‍රේමලාල් මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටි.එම්.චන්ද්‍රිකා තෙන්නකොන් මැතිණිය
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.ප්‍රියන්ත චාමින්ද මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. මහේෂ් කෝසල රාජකරුණා මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. සරත් කුමාර රාජපක්ෂ මැතිතුමා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.දූෂාන්ත ඉන්දික රන්දෙණිය මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ. චන්දක වීරසේන මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.කේ. ලලිත් පද්මසිරි විජය නන්ද මැතිතුමා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. උදයකුමාර් මැතිතුමා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී. චිත්‍රා ජයසිංහ පතිරණ මැතිණිය
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.එම්.පී.ජමිත් මැතිතුමා
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්ලිව්. චාමලී තුෂාරිකා ප්‍රනාන්දු මැතිණිය
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ධනුෂ්ක තිලකසිරි මැතිතුමා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එනස්ට් ඩෙන්සිල් ස්ලේඩන් මැතිතුමා
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. චන්ද්‍රසේකර මැතිතුමා
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.එම්. කරුණාදාස මැතිතුමා
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. චාමර ප්‍රසාද් ගුණසේකර මැතිතුමා
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රාසීක් මැතිතුමා
27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. එම්. හුසෙයින් මැතිතුමා
28. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.ඥානපාල සේනාධීර මැතිතුමා
29. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්. ප්‍රේමරත්න මැතිතුමා
30. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. දනිෂා මැතිණිය
31. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. මුත්තුකුමාර් මැතිතුමා
32. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්. පත්මිණී දිසානායක මැතිණිය
33. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්. සිත්ති උසෙයිමා මැතිණිය
34. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්. වසන්ත කුමාරන් මැතිතුමා
35. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එච්. අබ්දුල් හසීම් මැතිතුමා

36. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. තාහිර් මහරූෆ් මැතිතුමා
37. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ජබාර් තුවාන්කාසිම් මැතිතුමා
38. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. සිසිර දිලාන් ජයතිලක මැතිතුමා
39. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජ්.ජ්.ඩී. අමිත අමරසූරිය මැතිතුමා
40. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී. චූලනී ජයමාලි මැතිණිය
41. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ඉන්දික සේනාරත්න මැතිතුමා
42. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.සෝමසිරි බණ්ඩාර මැතිතුමා
43. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ශාන්තා ප්‍රසාදි දේශානි මැතිණිය
44. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්. කුසුමාවතී මැතිණිය

**01.පසුගිය මහ සභා රැස්වීම් වාර්තාව සහා සම්මත කිරිම .**

ගරු සභාපතිතුමා විසින් පසුගිය සභා වාර්තාව සංශෝධන ඇත්නම් ඉදිරිපත් කර සහා සම්මත කර ගන්නා ලෙස ඉල්ලා සිටින ලදි.

ඒ අනුව 2025.09.25 වන දින මහා සභා රැස්වීම් වාර්තාව **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ධනුෂ්ක තිලකසිරි මැතිතුමා හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.චන්දක වීරසේන මැතිතුමාගේ** යෝජනා ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත විය.

**02.** **ගරු සභාපතිතුමා විසින් කරන ලද නිවේදන් - නැත.**

**03. ප්‍රාදේශීය සභාව අමතා එවන සන්දේශ/පැමිණිලි/පෙත්සම්/සන්නිවේදන ලිපි - නැත**

**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත.**

**05.යථා පරිදි කල් දී ඇති යෝජනා**

**ගරු සභාපතිතුමාගේ යෝජනා**

**යෝජනා අංක 01**
**<u>උඩුබාදන ජල යෝජනා ක්‍රමය සදහා නව විදුලි මෝටරයක් මිල දී ගැනිම</u>**

2025.10.14 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවෙහි අංක 13 දරණ නිර්දේශය පරිදි උඩුබාදන ජල යෝජනා ක්‍රමය සදහා නව විදුලි මෝටරයක් මිල දී ගැනිම සඳහා රු.625,307.96 ක මුදල ප්‍රතිපූර්ණයට යටත්ව සහා අරමුදලින් ගෙවීම් කිරිම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එනස්ට් ඩෙන්සිල් ස්ලේඩන් මැතිතුමා** විසින් ස්ථිර කරන ලදි.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.10.30 දින සභාවේදී ඒකමතිකව සහා සම්මත විය.

**යෝජනා අංක 02**
**<u>නව ඡායා පිටපත් යන්ත්‍රය මිල දී ගැනිම</u>**

2025.10.14 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවෙහි අංක 15 දරණ නිර්දේශය පරිදි කාර්යාලයට ලබාගත් නව ඡායා පිටපත් යන්ත්‍රය සඳහා ගෙවිය යුතු වූ රු.702,100.00 ක මුදල සහා අරමුදලින් ජෝන් කිල්ස් ඔෆිස් ඔටෝමේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය වෙත (JONE KELLS OFFICE AUTOMATION (PVT)LTD) වෙත ගෙවීම් කිරිම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.මහේෂ් කෝසල මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.**

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.10.30 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ඉන්දික සේනාරත්න මැතිතුමා හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. සිසිර දිලාන් ජයතිලක මැතිතුමා පෙ.ව 9.05ට සභාවට පැමිණෙන ලදි.

**යෝජනා අංක 03**

**<u>කර්මාන්ත ඇස්තමේන්තු සඳහා අනුමැතිය ලබා ගැනිම</u>**

2025.10.14 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවෙහි අංක 16 දරණ නිර්දේශය පරිදි පහත සඳහන් කර්මාන්තයන් සඳහා සකස් කර ඇති ඇස්තමේන්තු පිළි ගැනිමටත්, ඒ අනුව කර්මාන්තයන් සිදු කරවාගෙන සභා අරමුදලින් ගෙවීම් කිරිමටත්, සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

| අඅ. | යෝජිත කර්මාන්තය | ඇස්තමේන්තු මුදල |
|---|---|---|
| 01 | දඹවින්න උප කාර්යාලය පරිශ්‍රය අසල ඇති කඩ කාමර මාර්ගය හා බුදු මැදුර අවට අලුත්වැඩියා කටයුතු කිරිම | රු.1,591,999.98 |
| 02. | සහන්පති පියස නිවාස සංකීර්ණයේ පිවිසුම් මාර්ගය සංවර්ධනය කිරිම | රු.749,332.16 |
| 03. | ගල්ඒදණ්ඩ උඩ කැන්දගොල්ල මාර්ගය කොන්ක්‍රිට් කිරිම | රු.996,262.93 |
| 04. | යල්පත්වෙල සිට ඇත්ඔලු කන්ද ගම්මානයට පිවිසෙන මාර්ගයේ පියල් ගුණසේකර මහතාගේ නිවස අසල බෝක්කු පද්ධතියක් හා කාණු පද්ධතියක් සකස් කිරිම | රු.1,658,365.76 |

එම යෝජනාව **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.ඉන්දික රන්දෙණිය මහතා** විසින් ස්ථිර කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.අජිත් ප්‍රේමලාල් මැතිතුමා හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටි.එම්.චන්ද්‍රිකා තෙන්නකෝන් මැතිණිය පෙ.ව 09.07 ට සභාවට පැමිණෙන ලදි.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.10.30 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 04**

**<u>නිම කරන ලද කර්මාන්තයන් සඳහා බිල්පත් පියවිම</u>**

2025.10.14 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවෙහි අංක 17 දරණ නිර්දේශය පරිදි පහත සඳහන් වැඩ නිම කරන ලද කර්මාන්තයන් සඳහා සභා අරමුදලින් ගෙවීම් කිරිම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

| අඅ. | නිම කරල ලද කර්මාන්තය | ගෙවීම් කරන ආයතනය | මුදල |
|---|---|---|---|
| **01** | කැප්පෙටිපොල ක්‍රිඩාංගණයේ ප්‍රේක්ෂකාගාරය ඉදි කිරිම. | බිබිලිගමුව ගොවි සංවිධානය | රු.1,737,488.91 |
| **02** | කැප්පෙටිපොල වෙළඳ සංකිර්ණයේ විදුලි ට්‍රාන්ස්ෆෝමර් කුටිය ඉදි කිරිම. | බිබිලිගමුව ගොවි සංවිධානය | රු.566,359.80 |

| | | | |
|---|---|---|---|
| **03** | හිඹිලියගොල්ල මැද පාර සංවර්ධනය කිරීම. | බිබිලිගමුව ගොවි සංවිධානය | රු.1,799,143.07 |
| **04** | බොරලන්ද බස් නැවතුම්පොල අලුත්වැඩියා කිරීම | පලහින්නාගොඩ ග්‍රාම සංවර්ධන සමිතිය | රු .122,050.37 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.චන්ද්‍රසේකර මහතා විසින් ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්.ඉන්දික සම්පත් මැතිතුමා**

ගරු සභාපතිතුමනි,මෙම කර්මාන්ත තුන සඳහාම ගිවිසුම් අත්සන් කරලා තියෙන්නේ බිබිලි ගමුව ගොවි සංවිධානයයි.ප්‍රාදේශීය ලේකම් කාර්යාල වැඩ වලදි නම් කර්මාන්ත සිදු කිරීමේ දි ගිවිසුම් අත්සන් කරනු ලබන්නේ අදාළ ප්‍රදේශයේ ගොවි සංවිධාන තිබේ නම් හා ඒවා ක්‍රියාත්මක නම් එම ගොවි සංවිධාන විසිනි.මෙහි දි කැප්පෙටිපොළ ව්‍යාපෘති සඳහා අත්සන් කර තිබෙන්නේ බිබිලිගමුව ගෙවි සංවිධානයයි .එසේම මේ ව්‍යාපෘති සදහා යන ඇස්තමේන්තුව කොපමණ ද යන්නත්, ලබා දෙන්නේ රඳවුම් මුදල ද නැත්නම් සම්පූර්ණ මුදල ද යන්න පිළිබඳවත් සඳහන් කරලා නෑ.මේ පිළිබඳව පැහැදිලි කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති ඩී.එම්.අජිත් කුමාර දිසානායක මැතිතුමා**

ඉන්දික මන්ත්‍රීතුමනි,මෙම ව්‍යාපෘති තුනම සිදු කරනු ලැබුයේ සභා ලේකම් පාලන කාල සීමාව තුළයි.එම නිසා මේ පිළිබඳව පැහැදිලි කර ගැනිම සඳහා කාරක සභා අවස්ථාවක් බවට සභාව පත් කර ගන්නා ලෙස මා ඉල්ලා සිටිනවා.

පසුව **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. සිසිර දිලාන් ජයතිලක මැතිතුමා** විසින් ගරු සභාව කාරක සභා අවස්ථාවත් බවට පත් කිරීම සුදුසු බවට යෝජනා කරන ලද අතර එම යෝජනාව **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ජබාර් තුවාන් කාසිම් මැතිතුමා** විසින් ස්ථිර කරන ලදි.ඒ අනුව ගරු සභාව කාරක සභා අවස්ථාවක් බවට පත්විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. තාහිර් මහරූෆ් මැතිතුමා පෙ.ව 9.10 ට සභාවට පැමිණෙන ලදි.**

අනතුරුව **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම් .එම්.දයාරත්න මැතිතුමා** විසින් කාරක සභා අවස්ථාව මහා සභා අවස්ථාව බවට පත් කිරීම සුදුසු බවට යෝජනා කරන ලදි .එම යෝජනාව **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.අජිත් ප්‍රේමලාල් මැතිතුමා** විසින් ස්ථිර කරන ලදි.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.10.30 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 05**

**<u>2025 ඔක්තෝම්බර් මස මන්ත්‍රී දීමනා ගෙවීම</u>**

වැලිමඩ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති,උප සභාපති හා ගරු මන්ත්‍රීතුමන්ලා, තුමියන්ලා 2025 ඔක්තෝම්බර් මස මන්ත්‍රී දීමනා වශයෙන් රු.675,000.00 ක මුදලක් ප්‍රතිපූර්ණයට යටත්ව සභා අරමුදලින් දැරීමට සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.එම්.පි.ජමිත් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.10.30 දින සභාවේදී එකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 06**

**<u>2025 ඔක්තෝම්බර් මස දෛනික වැටුප් ගෙවීම</u>**

වැලිමඩ ප්‍රාදේශීය සභාවේ දෛනික සේවයේ නිරත සේවන මහත්ම මහත්මීන් 36 දෙනෙක් සඳහා ඔක්තෝම්බර් මස දෛනික වැටුප් වශයෙන් රු.2,220,992.50 ක මුදලක් ප්‍රතිපූර්ණයට යටත්ව සභා අරමුදලින් දැරීමට සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී** එස්.එම්.රාසීක් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.10.30 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 07**

**<u>වැලිමඩ ඔරලෝසු කණුව අසල ඇළ මාර්ගයේ පැති බැම්ම ඉදි කිරීම පිළිබඳ සංවර්ධන යෝජනාව</u>**

වැලිමඩ නගරයේ ඔරලෝසු කණුව අසළින් දිවෙන ඇළ මාර්ගයේ පැති බැම්ම කැඩී ගොස් ඇති බැවින්,නගරයට විශාල ඉඩ ප්‍රමාණයක් ඇහිරී ගොස් ඇත.එසේම එම පැති බැම්ම පිරවීම තුළින් වැලිමඩ නගරයේ පවතින රථ වාහන තදබදය අවම කර ගත හැකිය.එබැවින්, එම කර්මාන්තය සඳහා වැය වන රු.1,970,000.00 ක ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවටත්,එම කර්මාන්තය නිම කර අදාළ බිල්පත් සභා අරමුදලින් ගෙවීම් කිරීම සුදුසු බවටත්, මම මෙම ගරු සභාවට යොජනා කර සිටිමි.

එම යෝජනාව **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම් සරත් කුමාර මැතිතුමා** විසින් ස්ථිර කරන ලදි.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.10.30 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති ඩී.එම්.අජිත් කුමාර දිසානායක මැතිතුමා**

ගරු උප සභාපතිතුමනි,ගරු මන්ත්‍රි තුමනි,තුමියනි,සභා ලේකම් ඇතුළු කාර් මණ්ඩලයෙන් අවසරයි.2026 වර්ෂයේ අයවැය කෙටුම්පත සමබන්ධ යෝජනාව ඉදිරිපත් කිරීමට පෙර අයවැය රීති ප්‍රකාරව ගරු සභාපතිගේ ප්‍රතිපත්ති ප්‍රකාශය මෙසේ ඉදිරිපත් කර සිටිමි.

**ගරු සභාපතිතුමාගේ පණිවිඩය**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 168 වන වගන්ති ප්‍රකාරව හා 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහයේ i පරිච්ඡේදයේ සඳහන් ආකාරයට හා 2020.10.29 දින අංක 2199/25 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කරන ලද 2020 ප්‍රාදේශීය සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීති අනුව සකස් කර 2025.10.14 වන දින මුදල් හා ප්‍රත්පත්ති සැකසීමේ කමිටුවේ අංක 09 යටතේ නිර්දේශ කරන ලද 2026 වර්ෂයට අදාළව සකස් කරන ලද අයවැයට අනුව මාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කරමි.

**‘‘ පොහොසත් රටක් - ලස්සන ජීවිතයක් ’’**

වත්මන් රජයේ ප්‍රතිපත්තිමය සාරය මෙයයි. ඊට සමගාමීව අපගේ බල ප්‍රදේශයේ ජනතාවටත් සියළු ක්ෂේත්‍රයන්ගෙන් පොහොසත් ‘‘ ලස්සන ජීවිතයක් ’’ උරුම කර දීම මාගේත් සිහිනයයි. එය ඔබගේත් සිහිනයම වෙතැයි මා උදක්ම අපේක්ෂා කරමි.

ගරු මන්ත්‍රීතුමනි, මන්ත්‍රීතුමියනි,

සුන්දර වැලිමඩ සානුවේ ජනතාවගේ එනම් අප බල ප්‍රදේශයේ ජනතාවගේ දිවිය එතරම්ම සුන්දර නොවන බව අපි සැවොම දන්නා කරුණකි.සොබාදහම තිළිණ කළ ඒ සුන්දරත්වය අප බල ප්‍රදේශයේ ප්‍රජාවගේ ජීවිතයෙනුත් පිළිබිඹු වන්නේ නම් කොතරම් අගනේද?එවැනි ජීවිතයක් සාක්ෂාත් කොට සියළු ක්ෂේත්‍රයන්ගෙන් පොහොසත් ලස්සන ජීවිතයක් උදාකර දීමේ වගකීම අද දවසේ මට ඔබට පැවරී තිබේ.
ගරු මන්ත්‍රීවරුණි.

අදූරදර්ශී මෙන්ම දිගුකාලීන ඉලක්ක හා සැලසුම් රහිතව මැදිහත් වීමේ ප්‍රතිඵල ඔබ අප පසුගිය අවුරුදු කිහිපය තුල සජීවී ලෙස අත්වින්දෙමු. එවන් ඉරණමක් අත් වූ අප රට, දැන් දැන් නැවතත් ආර්ථික වශයෙන් ශක්තිමත් වෙමින්, නව දේශපාලන සංස්කෘතියක් තුල ඉදිරියට යමින් තිබේ.එය මෙතෙක් පැවති දේශපාලන සංස්කෘතිය පිම් ගණනාවකින් වෙනස් කොට තිබේ.රටක හැරවුමකට ආර්ථික පරිවර්තනයන් ප්‍රමුඛ වන්නා සේම අදූෂිත ස්වාර්ථය පරාජය කර පරාර්ථය ප්‍රමුඛ කරගත් දේශපාලන සංසකෘතියක්ද වුවමනා වන්නේමය.එය මේ වන විට ආරම්භ වී ඇති අතර එය ශක්තිමත් කිරීම වෙනුවෙන් මමත් ඔබත් අදත් හෙටත් පොර බැදිය යුතුව තිබේ. එමෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සීමා මායිම් තුල සිදිමින් කරනු ලබන විශිෂ්ට ආර්ථික කළමනාකරණයේත්, නොබැදි රාජ්‍ය ප්‍රතිපත්තිය මත පිහිටා කරනු ලබන ජාත්‍යන්තර ගණුදෙනුව තුලින් ගොඩනැගෙන විදෙස් සබඳතා මඟින් ඇතිවන ආර්ථික ප්‍රසාරණයෙනුත්, සංචාරක කර්මාන්තයේ වර්ධනය, විදෙස් ප්‍රේෂණ ඉහල යාම, අපනයන ආදායම වැඩිවීම,දේශීය ආදායම් ප්‍රභවයන් ශක්තිමත් විම හා විධිමත් වීම වැනි සාධක මත රටේ ආර්ථිකය සම්බන්ධයෙන් ජාත්‍යන්තර ප්‍රමිති ආයතනයන්ගේ සහ ජාත්‍යන්තර ආයතනවල පවා ඇගයීමට ලක්වී තිබේ.එය රටේ ආර්ථික ස්ථායීතාවය පිළිබඳව වඩා යහපත් චිත්‍රයකි.මේ හා සමගාමීව නීති ආධිපත්‍ය නිසි ලෙස තහවුරුවීම , විෂමත්ද්‍රව්‍ය හා පාතාලයට එරෙහිව වන අනවරථ අරගලය විසින්ද රටේ ප්‍රමිතිය පිළිබද ලෝකයේ විශ්වාසය තව තවත් තහවුරු වෙමින් තිබේ. එමෙන්ම **'' පොහොසත් රටක් - ලස්සන ජීවිතයක් '' ඇති කිරීමේ රාජ්‍ය දැක්ම සාක්ෂාත් කිරීම වෙනුවෙන් ක්‍රියාත්මක වන Clean Sri lanka වැඩ සටහන ,Digital කරන වැඩ සටහන, ග්‍රාමීය දිළිඳුකම පිටු දැකීම පිළිබඳ වැඩසටහන යන ජාතික වැඩසටහන් වල යම් සැලකිය යුතු පංගුවක් පළාත් පාලන ආයතනයන් වෙත පැවරී තිබේ.එම වගකීම පෙරදැරි කරගෙන** වැලිමඩ ප්‍රාදේශීය සභාව ලෙස අප බල ප්‍රදේශයේ පොදු ජනයාගේ ජීවිත පොහොසත් කරන ලස්සන කරන 2026 අයවැය ලේඛනයෙන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති ව්‍යාපෘති රාශියකි.
ඒවා පහත පරිදි වේ.

- මා විසින් ඉදිරිපත් කරනු ලැබූ අයවැය කෙටුම්පතේ සඳහන් පරිදි ගරු මන්ත්‍රීතුමන්ලා ගරු මන්ත්‍රීතුමියන්ලා 44 දෙනා සඳහා එක් යෝජනාවකට රු.1,000,000.00 ක උපරිමයකට යටත්ව සංවර්ධන යෝජනා 44 ක් ක්‍රියාත්මක කිරීම. මෙහිදී ප්‍රදේශයේ සංවර්ධන කටයුත්තක් ඉලක්ක කර ගනිමින් ප්‍රදේශයේ මහජන නියෝජිතයින් විසින් රු.1,000,000.00කට යටත්ව සංවර්ධන යෝජනාව ක්‍රියාත්මක කල යුතුය.

- වැලිමඩ නගරයේ නව වෙළඳ සංකීර්ණය, රථ වාහන අංගනය හා කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීම. මේ සඳහා දේශීය ණය සංවර්ධන අරමුදලෙන් රු.100,000,000.00 ණය මුදලක් ද ඊට සමානුපාතිකව සභාව සතු ස්ථාවර තැම්පතු මුදල් වලින් රු. 20,000,000.00 මුදලක් ද ලබා ගනිමින් සමස්ථ ප්‍රතිපාදන ලෙස රු.120,000,000.00 මුදල යොදා ගනිමින් වැලිමඩ නගරයේ හේමපාල මුනිදාස මාවතේ දැනට තාවකාලික රථ වාහන අංගනය සහිත ඉඩමේ, වැලිමඩ නගරයට අවශ්‍ය රථ වාහන ගාල් කිරීමේ ස්ථානයක්, වෙළඳ සංකීර්ණයක්,සහා කාර්යාල පරිශ්‍රයක් ඉදී කිරීමටත්, ඒ තුළින් ස්වයං උත්පාදන ආදායම වැඩි කර ගැනීමට මෙන්ම වර්ථමාන හා අනාගතයට ගැළපෙන පරිදි ප්‍රාදේශීය සභා කාර්යාලය ඉදි කිරිමට මා බලාපොරොත්තු වෙමි. මෙම ව්‍යාපෘතිය අදියර වශයෙන් ක්‍රියාත්මක කිරීමටද වැඩිදුරටත් අපේක්ෂා කරමි.

- 2026 අයවැය කෙටුම්පතේ ඉදිරිපත් කර ඇති යෝජනා ක්‍රියාත්මක කිරිමට පළාත් විෂය නිශ්චිත සංවර්ධන ප්‍රදාන, උපමාන පාදක, විමධ්‍යගත අරමුදල් උපයෝගි කර ගනිමින් පළාත් පාලන මාර්ග සංවර්ධනය, ප්‍රජා ජල සම්පාදනය, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය, පළාත් පාලන වෙනත් සේවා යන විෂයන් ආවරණය වන පරිදි සංවර්ධන කටයුතු සිදු කිරීමට මා බලාපොරොත්තු වෙමි.

- එසේම වැලිමඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය නිරන්තරයෙන්ම වර්ෂා කාල වලදි ආපදාවන්ට ලක් වන ප්‍රදේශයක් වන බැවින් සහ අධික සුළං සහිත තත්වයන්ට මුහුණ දෙන බැවින් ඉදිරියේදී ඇතිවීමට හැකි හදිසි ආපදා සඳහා මුහුණ දීමට 2026 අයවැය ලේඛනයෙන් සැලකිය යුතු මුදලක් වෙන් කිරීමට මම බලාපොරොත්තු වෙමි.

- වැලිමඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනගහනය සැලකිමේදී කාන්තා හා ළමා ජනගහනය මුළු ජන ගහනයෙන් 50 % කි. ඒ අනුව පසුගිය වර්ෂ කිහිපයක අයවැය ලේඛන අධ්‍යයනය කිරීමේදි ඔවුන් වෙනුවෙන් සැලකිය යුතු ප්‍රතිපාදන වෙන් කිරීමට මෙම සභාව අපොහොසත් වී ඇති අතර මෙම අයවැය තුළින් ඔවුන් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට මම බලාපොරොත්තු වෙමි. ඒ තුළින් කාන්තා හා ළමා අයිතීන් සුරැකීමට හා ඔවුන්ගේ අවශ්‍යතා ඉටු කිරීමටත් මම උත්සහ කරමි.

- 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ ප්‍රධාන කාර්යයක් ලෙස මහජන සෞඛ්‍ය විෂය නම් කර ඇති අතර ඒ සඳහාද මෙම අයවැයෙන් අවධානය යොමු කර ප්‍රතිපාදන වෙන් කිරිමට කටයුතු කර ඇත. එමගින් මාතෘ හා ළමා සායන මධ්‍යස්ථාන සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වෙමි.

- ඉහත කරුණු වෙත අවධානය යොමු කරමින් සකස් කරන ලද අයවැය මඟින් රැස් කරගන්නා ලද ස්වයං උත්පාදන ආදායමෙන්, පුනරාවර්තන වියදම් හා කොට්ඨාශ මට්ටමින් මන්ත්‍රීතුමන්ලා හරහා සිදු කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතිවල වියදම් හැරුණු කොට ඉතිරි වන්නා වූ ආදායම මඟින් ප්‍රාදේශීය සභාවේ විෂය පථයට අනුකූල වන්නා වූත් ඉදිරි වර්ෂ වලදී සභාවේ ස්වයං උත්පාදන ආදායම වර්ධනය කර ගැනීමට දායක වන්නා වූත් පහත ව්‍යාපෘති ඉටු කිරීමට මම බලාපොරොත්තු වෙමි.
    - ඩයරබා උප කාර්යාලයට අයත් යල්පත්වෙල පෙර පාසල සඳහා ගොඩනැගිල්ලක් ඉදි කිරීම.
    - බොරලන්ද ප්‍රදේශයේ නව පෙර පාසලක් ආරම්භ කිරීම.
    - ආදාහනාගාරයේ පාලර් එක ඉදි කිරීම
    - ඩයරබා වෙළඳ සංකිර්ණයේ දෙවන අදියර ඉදි කිරීම.
    - බෝගහකුඹුර නගරයේ අත්හැර ඇති ඉඩම් කොටසේ වෙළඳ සංකිර්ණය ඉදි කිරීම.
    - කැප්පෙටිපොළ වෙළඳ සංකිර්ණය ඉදි කිරීම.
    - බොරලන්ද වෙළඳ සංකිර්ණය ඉදි කිරීම.
    - වැලිමඩ නගරයේ නව රථ වාහන අංගනයක් ඉදී කිරීම.
    - වැලිමඩ නගරයේ පොළ භූමිය සංවර්ධනය කිරීම.
    - වැලිමඩ උඩ දෙමෝදර ඉඩමේ වෙළඳ සංකීර්ණයක් ඉදි කිරීම.

- ඉහත සංවර්ධන කටයුතු සිදු කරන්නේ සභාවේ ස්ථිර සේවකයන්ගේ වැටුප් ගෙවීමේදී එම වැටුපෙන් 20% ක මුදලක් සහා අරමුදලේ ස්වයං උත්පාදන ආදායමෙන් වෙන් කිරීමෙන් අනතුරුව වන අතර 2026 වර්ෂයට අදාළව ස්වයං උත්පාදන ආදායම, ණය මුදල් ලැබීම් සහ විවිධ ප්‍රභවයන්ගෙන් ලැබෙන මුදල් පදනම් කරගෙන රු.449,974,174.00 ආදායමක් ඉපයීමට බලාපොරොත්තු වන අතර එයින් පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් ලෙස රු.449,963,524.00 ක වියදමක් දැරීමට මා බලාපොරොත්තු

වේ.එසේම අතිරික්තය වන රු.10,650.00 ක මුදලක් සමුච්චිත අරමුදලට බැර කිරීමට මා අපේක්ෂා කරමි.

තවද මාගේ කටයුතු වලට මග පෙන්වමින් ඒ සඳහා සහයෝගය ලබා දුන් ඌව පළාත් ප්‍රධාන ලේකම්තුමිය, පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්තුමා හා පළාත් පාලන කොමසාරිස්තුමාට මාගේ ගෞරවණීය ස්තූතිය පිරිනමමි.

එසේම මෙම කටයුතු කරගෙන යාම සඳහා සභා ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩලයෙන් ලැබුණු ශක්තියට ඒ නිලධාරි මහත්ම මහත්මීන්ට මාගේ ස්තූතිය ප්‍රකාශ කරන අතර ඉදිරි 2026 වර්ෂයේ දීද ඔබ සියළු දෙනාගේම අදහස් හා යෝජනා තුලින් ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීමට මාගේ පූර්ණ ශක්තිය යොදා කැපවන බවට ප්‍රකාශ කරමි.

**යෝජනා අංක 08**

**<u>2026 වර්ෂයේ අයවැය කෙටුම්පත සදහා අනුමැතිය ලබා ගැනිම</u>**

1987අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 168 වන පරිජේදයේ සඳහන් ආකාරයට ප්‍රාදේශිය සභාවේ ගරු සභාපතිවරයාට ලැබී ඇති බලතල ප්‍රකාරව සහ ප්‍රාදේශිය සභා මූල්‍ය හා පරිපාලන රීති සංග්‍රහයේ ii වන පරිජේදයෙන් පෙන්වා දී ඇති ආකාරයට පළාත් පාලන ආයතනයක් ඉදිරි වර්ෂයක් සඳහා අපේක්ෂිත ආදායම් හා වියදම් ඇස්තමේන්තු ඇතුළත් වාර්ෂික අයවැය ලේඛනයක් ඉදිරිපත් කළ යුතුව ඇත.
ඒ අනුව අංක 2199/25 දරණ 2020 ඔක්තෝම්බර් මස 29 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ 10.1 වගන්තියට අනුව වැලිමඩ ප්‍රාදේශිය සභාවේ 2026 වර්ෂය සඳහා සකස් කරන ලද අය වැය කෙටුම්පතෙහි,

- <u>**වැඩසටහන් අංක 01 පොදු පරිපාලන සේවා**</u> යටතේ 2026 වර්ෂයට ඇස්තමේන්තුගත කළ ආදායම **රු.127,586,183/-** ක් ද, ඇස්තමේන්තුගත කළ වියදම **රු.107,428,200/- ක්** ද ,ප්‍රාග්ධන වියදම රු.3,000,000/- ක්ද,
- <u>**වැඩසටහන් අංක 02**</u> සෞඛ්‍ය සේවා යටතේ 2026 වර්ෂයට ඇස්තමේන්තුගත කළ ආදායම රු.35,837,680/- කින්ද ,ඇස්තමේන්තු ගත කළ වියදම **රු.50,925,300/- ක්** ද, ප්‍රාග්ධන වියදම රු.1,500,000-/ ක්ද,
- <u>**වැඩසටහන් අංක 03 මාර්ග ,ඉඩම් හා ගොඩනැගිලි**</u> යටතේ 2026 වර්ෂයට ඇස්තමේන්තුගත කළ ආදායම **රු.30,265,450 -ක්ද** .ඇස්තමේන්තු ගත කළ වියදම **රු23.,971,400/- ක්ද** ,ණය පොළි ආපසු ගෙවීම් රු.3,750,000.00 ක්ද .
- <u>**වැඩසටහන් අංක 04 ජල සේවා**</u> යටතේ 2026 වර්ෂයට ඇස්තමේන්තු ගත කළ ආදායම **රු.4,459,200/-** ක්ද ,ඇස්තමේන්තුගත කළ වියදම **රු.1,912,200/-ක්ද**, ප්‍රාග්ධන වියදම රු.400,000 ක්ද,
- <u>**වැඩසටහන් අංක 05 වෙනත් උපයෝගී සේවා**</u> **යටතේ** 2026 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත කළ ආදායම **රු.90,406,661/-** ක්ද,ඇස්තමේන්තුගත කළ වියදම **රු.5,562,200/-ක්ද** , ප්‍රාග්ධන වියදම රු.600,000 ක්ද,
- <u>**වැඩසටහන් අංක 06 සුභ සාධන සේවා යටතේ 2026 වර්ෂය සඳහා**</u> ඇස්තමේන්තුගත කළ ආදායම **රු.6,419,000/-** ක්ද,2026 වර්ෂයට ඇස්තමේන්තුගත කළ වියදම **රු.15,133,900/-** ක්ද ,ප්‍රාග්ධන වියදම **රු.3,900,000** කින්ද යුත්

සමස්ථ ස්වයං උත්පාදිත ආදායම **රු.191,913,934.00** ක්ද ,මුළු සහා අරමුදලින් සිදු කරන වියදම රු.191,903,284.00 කින්ද,අතිරික්තය රු.10,650.00 ක් ද වන 2026 වර්ෂය සඳහා වූ අයවැය කෙටුම්පත සභා සම්මත කර ගැනිම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව **ගරු උප සභාපති එම්.එල්.එම්.සෆ්වාන් මැතිතුමා විසින් ස්ථිර** කරන ලදි.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති ඩී.එම්.අජිත් කුමාර දිසානායක මැතිතුමා**

ගරු උපසභාපතිතුමනි,ගරු මන්ත්‍රීතුමනි,තුමියනි, 2020 වර්ෂයේ ඔක්තෝම්බර් මස 29 වන දින ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් ඉදිරිපත් කරන අය වැය රීති අනුව 11 වන වගන්තියේ 02 වන ඡේදයේ අයවැය ලේඛනය සඳහා සංශෝධන ඉදිරිපත් කරන ආකාරය සඳහන් වනවා. එහි 02 වන වගන්තිය අනුව අයවැය ලේඛණයට සංශෝධන කිසිවක් ඉදිරිපත් වී නොමැති නම් ඒ බව සභාපතිවරයා විසින් එකී මහා සභා රැස්වීමේ දි නිවේදනය කල යුතු අතර අය වැය ලේඛණය සඳහා සංශෝධන ඉදිරිපත් කර ඇත්නම් ඒවා ලැබී ඇති අනුපිලිවෙල අනුව ඊළඟ වර්ෂයේ අයවැය ලේඛණය අවසාන වශයෙන් සලකා බලන රැස්විම ආරම්භ කල වහාම එම සංශෝධන යෝජනා පිටපතක් බැගින්,සෑම සභිකයෙකු වෙතම ලබාදිමට සැලැස්විම සභාපතිවරයාගේ කාර්ය භාරය විය යුතුය.

ඒ අනුව මෙම අයවැය කෙටුම්පත සඳහා කිසිදු සංශෝධනයක් මේවන විට ඉදිරිපත් වී නැත.එබැවින්, 2026 වර්ෂයේ අයවැය කෙටුම්පත සඳහා කිසිදු සංශෝධනයක් ඉදිරිපත් වී නොමැති බව නිවේදනය කර සිටිමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.ප්‍රියන්ත චාමින්ද මැතිතුමා**

ගරු සභාපතිතුමනි,සංශෝධන ඉදිරිපත් කරන්න තියෙනවා.ඒ සඳහා සභාවේ අවස්ථාවක් ලබා දෙනවාද? එසේම සංශෝධන ඉදිරිපත් කරන්නේ කොහොමද යන්නත් පැහැදිලි කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති ඩී.එම්.අජිත් කුමාර දිසානායක මැතිතුමා**

මන්ත්‍රීතුමනි,සංශෝධන ඉදිරිපත් කරනවා නම් අයවැය රීතී අනුව ඉදිරිපත් කල යුතු අතර අයවැය ලේඛණය ඉදිරිපත් කිරිමට වැඩ කරන දින 03කට පෙර ලේකම්තුමාට ලිඛිතව සංශෝධන ඉදිරිපත් කල යුතුය.මේවන විට කිසිදු සංශෝධනයක් ඉදිරිපත් වී නැත.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.ප්‍රියන්ත චාමින්ද මැතිතුමා**

ගරු සභාපතිතුමනි,මෙම අයවැය කෙටුම්පතෙහි ඔබතුමා විසින් සංවර්ධන යෝජනා ලබා දෙන ලෙසට පසුගිය සභාවාරයේදි නිවේදනය කරනු ලැබුවා.අප විසින් සංවර්ධන යෝජනා වෙන වෙන ඔබතුමාට ඉදිරිපත් කරනු ලැබුවත්,එම යෝජනා එකක්වත් මෙහි සඳහන් වෙලා නෑ.එවගේම එක් ව්‍යාපෘතියක්ද, නැතිනම් සංවර්ධන යෝජනා කිහිපයක්ද සිදු කරන්නේ යන්න පැහැදිලි කරන ලෙස මා ඉල්ලා සිටිනවා. එසේම ගරු සභාපතිතුමනි, එක් යෝජනාවකට ලක්ෂ 10 ක උපරිම සිමාවකට යටත්ව කටයුතු කරන ලෙස මෙහි සඳහන්ව තිබෙන අතර ගරු සභාපතිතුමනි, සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරිමේ දි මෙය ගැටළුවක් විය හැකිය .එබැවින්, මේ පිළිබඳව පැහැදිලි කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති ඩී.එම්.අජිත් කුමාර දිසානායක මැතිතුමා**

ගරු මන්ත්‍රීතුමනි,11 වගන්තියේ සභාපතිවරයා විසින් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන ඊළඟ වර්ෂයේ අයවැය ලේඛණයට, සභාවේ යම් සභිකයකු විසින් සංශෝධන ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර ස්වකීය අත්සනින් යුතුව සංශෝධනයට පාදකවන හේතු සමඟ වැඩ කරන දින තුනකට පෙර ලේකම්වරයා වෙත භාර

දිය යුතු බවට සඳහන් වනවා.ප්‍රියන්ත මන්ත්‍රීතුමනි,මා මෙය සඳහන් කිරිමට සිටියේ පසුව වුවත්, ඔබතුමාගේ ප්‍රකාශයත් සමග මා මෙය කිව යුතුය.පළාත් පාලන ආයතනවල අයවැය කරණයට ආදාළ නිර්දේශ වාර්තාව තුළ අයවැය සම්පාදක නිර්ණායක යටතේ එක් එක් වැඩසටහන්වල ව්‍යාපෘති ක්‍රියාත්මක ප්‍රමුඛතාවය මත මිස පුද්ගලයාගේ ප්‍රමුඛතාවය මත ප්‍රතිපාදන වෙන් නොකල යුතු බවට සඳහන් වනවා.ඒඅනුව මෙහි අදහස වන්නේ කිසිදු මන්ත්‍රිවරයෙක් සඳහා පුද්ගලිකව ප්‍රතිපාදන වෙන් කල නොහැකි බවයි.තවද අයවැයෙන් මුදල් වෙන් කල යුත්තේ වැඩසටහන්වලට මිස සභිකයින්ට නොවන බවට පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍ර ලේඛ 03 හි සඳහන් කර ඇතිබව මෙම වාර්තාව තුලම සඳහන් වේ.ඒවගේම අප කටයුතු කරන්නේ පවතින නිතී රිති,අණ පනත් රේගුලාසි ,චක්‍රලේඛ අනුවය. මන්ත්‍රීතුමනි.සංවර්ධන යෝජනා එකක් හෝ කිහිපයක් සිදු කල හැකිය.ඒ සඳහා අප ලක්ෂ 10 ප්‍රතිපාදන ලබාදෙනවා.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ප්‍රභාත් රවින්ද්‍ර මැතිතුමා**

ගරු සභාපතිතුමනි, අපි බලාපොරොත්තු වුයේත්,ලක්ෂ 10 ක මුදල සංවර්ධන යෝජනා සඳහා යෙදවිමටයි.එසේම කොට්ඨාශය තුළ සිටින ජනතාවට සේවය කිරිම සඳහා වු සංවර්ධන යෝජනාවන්ට යොදවන්නේ රුපියල් ලක්ෂයද,පනස්දාහද කියලා අපට ගැටළුවක් නෑ. මෙම අයවැය කෙටුම්පතෙහි සංවර්ධන යෝජනා 98 ක් සඳහන් කරලා තියෙනවා.මෙම සංවර්ධන යෝජනා ලැබුණු ආකාරය පැහැදිලි කරන ලෙස මා ඉල්ලා සිටිනවා.ඒවගේම ගොඩනැඟිලි ඉදි කිරිම සම්බන්ධයෙන් ණය හා ස්ථාවර තැන්පත් භාවිතා කරන බවත් ,සඳහන් කලා.මේ පිළිබඳවත් පැහැදිලි කරන ලෙස මා ඉල්ලා සිටින අතරම එක් මන්ත්‍රි වරයෙක් සඳහා රුපියල් ලක්ෂ 10 ක මුදල ලබා දිම පිළිබඳ මා සතුටු වන අතර පසුගිය සභාවල දි නම් ලබා දෙන මුදල සංවර්ධන ව්‍යාපෘති සඳහා වියදම් කිරිමට අපට නිදහස තිබුනා.මේ නිසා මෙම අයවැය යටතේ ලබා දි තිබෙන ප්‍රතිපාදන වැඩි වුවත්,එම මුදල අපගේ අභිමතය පරිදි සංවර්ධන ව්‍යාපෘති සඳහා වියදම් කිරිමට නොහැකිවිම සම්බන්ධයෙන් සතුටු විය නොහැකිය.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජේ.එම්.ඉන්දික සම්පත් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, 2026 වර්ෂයේ අයවැය කෙටුම්පෙතහි පහත සඳහන් කාරණා කෙරෙහි ඔබතුමාගේඅවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

- ✓ ආදායම් ඇස්තමේන්තුව ගත්විට එහි 41 පිටුවේ අංක 40 යටෙත් සේවා හා ගාස්තුවල 2025 වර්ෂයේ රුපියල් 40,114,000.00 ක් ඇස්තමේන්තුගත කරලා තියෙනවා.ඒවගේම 2025 වර්ෂයේ මේවන විට රුපියල් 36,096,362.00 ක මුදලක් ලැබිලා තියෙනවා.නමුත් 2026 වර්ෂයේ ඇස්තමේන්තු කර තිබෙන්නේ රුපියල් 30,140,000.00ක මුදලකි.මේ අනුව බලන විට කෝටියක පමණ මුදලක් අඩුවෙන් මෙම වර්ෂයේ ඇස්තමේන්තු කරලා තියෙනවා.එසේ අඩුවෙන් ඇස්තමේන්තු කිරිමට හේතුව පිළිඳවත්,

- ✓ අංක 60 (i) යටතේ ස්ථාවර ඉතිරුම්,වෙනත් ආදායම් යටතේ 2024 වර්ෂය සඳහා රුපියල් 16,579,064.00 ක මුදලක් ඇස්තමේන්තුගත කර ඇති අතර 2025 වර්ෂයේ මේවන විට රුපියල් 5,035,671.00 ක මුදලක් පොළි වශයෙන් ලැබිලා තියෙනවා.එසේම මෙම වර්ෂය නිම විමට තව කාලයක් තිබෙනවා.නමුත් 2026 වර්ෂයේ රුපියල් 9,600,000.00 ක මුදලක් ඇස්තමේන්තු කර තිබෙන අතර මේ දෙක අතර විශාල පරතරයක් දක්නට ලැබෙනවා. මා දන්නා තරමින් පොළි අනුපාතය වෙනස් වෙලා නෑ.මේ නිසා ඉදිරියේදි ස්ථාවර තැන්පත් මාරු කිරිමට සැලසුම් කර තිබෙනවාද යන්න පිළිබඳවත්,

- ✓ අංක 60 යටතේ බලපත්‍ර ගාස්තු යටතේ 30 (iii) විශේෂ බලපත්‍ර ගාස්තු වල තාවකාලික සෝගාතකාගාර සඳහා 2024 වර්ෂයේ රුපියල් 1,502,500.00 ක මුදලක් හා 2025 වර්ෂයේ රුපියල් 1,620,000.00ක මුදලක් ඇස්තමේන්තු කර තිබෙනවා.මෙය රුපියල් 8701,000.00 ක මුදලක් දක්වා

අඩු වෙලා තියෙනවා.මේ පිළිබදව හා තාවකාලික සෝ්ගාතකාගාර හා ලියාපදිංචි සෝ්ගාතකාගාර පිළිබඳව අප දැනුවත් නෑ.මේ පිළිබඳවත්,

- ✓ සභාවේ ආදායම් සඳහා ප්‍රචාරක පුවරු තුළින් එකතු කරන බව පෙනි යන කරුණකි.2024 වර්ෂයේ රුපියල් 1,512,429.00 ක් ද, එය 2025 වර්ෂයේ 1,100,000.00 ක මුදලකින් අඩුවෙලා තියෙනවා.නමුත් 2026 වර්ෂයේ එය රුපියල් 3,000,000.00 දක්වා වැඩි වෙලා තියෙනවා.ගරු සභාපතිතුමනි,මෙය එක් පැත්තකින් හොඳ වැඩසටහනක් වන අතරම වැලිමඩ ව්‍යාපාරිකයින්, වැලිමඩ ජනතාවට පීඩාවට පත්ව සිටින අවස්ථාවක මෙසේ ප්‍රචාරක පුවරු සඳහා වැඩි ඇස්තමේන්තුවක් ඉදිරිපත් කිරිම තුළින් ජනතාවට පීඩාකාරි කෙටුම්පතක් වන බව පෙනියනවා. එසේම සභාවක් ලෙස ආදායම් උපයන්න අවශ්‍යයි. නමුත් මේ සඳහා ඉදිරිපත් කර ඇති ඇස්තමේන්තුව සාධාරණ නැති බව කිව යුතුය.
- ✓ ගිය සභාවලදි ඔබතුමා විසින් පොදු වැසිකිළිය සමාජ සේවයක් ලෙස වෙන් කිරිම සුදුසු බවට අදහස් දැක්වුවා.නමුත් අද වනතුරුත් එය ඉෂ්ට වෙලා නැති අතරම මෙම ඇස්තමේන්තුවේ දි වැසිකිළි සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන තුළින් පොදු වැසිකිළිය සමාජ සේවයක් වන්නේ නැති බව පෙනි යනවා.
- ✓ 43 පිටුවේ වැඩසටහන් අංක 03 යටතේ මාර්ග හා ඉඩම් ගොඩනැඟිලි යටතේ 24 (ii) බදුදිම ඉඩම් වල මූලික තැන්පත් ගාස්තු රුපියල් 10,000,000.00 ක මුදලක් කැප්පෙටිපොල උප කාර්යාලයට ඇස්තමේන්තු කර තිබෙන අතර කැප්පෙටිපොල කුමන ඉඩමද එවැනි මුදලකට බදුදිමට ඇත්තේ යන්න පැහැදිලි කරන ලෙසත්,
- ✓ තවද කඳන් ප්‍රවාහනය සඳහා ලොකු මුදලක් වැඩි කර තිබෙනවා.
- ✓ පිටු අංක 49 හි වියදම් ඇස්තමේන්තුව යටතේ නිල ඇඳුම් සඳහා 2024 වර්ෂයේ රුපියල් 12,000.00 ක්ද,2025 වර්ෂයේ රුපියල් 70,000.00 ක්ද වශයෙන් සඳහන් වි ඇති අතර 2026 වර්ෂයේ එය රුපියල් 180,000.00 දක්වා වැඩි කර තිබෙනවා.මේ පිළිබඳවත්
- ✓ ගමන් වියදම් වැඩි වෙලා තියෙනවා.එවගේම පිටු අංක 50, වැඩ සටහන් අංක 01 පොදු පරිපාලන වියදම් අංක 05 (2) දුරකථන සම්බන්ධතා මන්ත්‍රී යන්න සඳහන් කර ඇති වැඩසටහනේ 2024 වර්ෂයේ රුපියල් 66,000.00 ක්ද,2025 වර්ෂයේ රුපියල් 576,000.00ක් හා මේවන තෙක් රු.24,000.00 ක මුදලක් ද සඳහන් කර තියෙනවා.එවගේම 2026 වර්ෂයේ රුපියල් 700,000.00ක්ද වශයෙන් ඇස්තමේන්තු කර තියෙනවා.පසුගිය අවුරුදු වල මන්ත්‍රිවරු සිටියේ නැති අතර මේ සම්බන්ධයෙන්ද ඇස්තමේන්තු කර ඇති මුදල් මේ පිළිබඳවත්,
- ✓ පිටු අංක 50,5 (09) පළාත් පාලන සතිය,විගණනය සඳහා 2024 වර්ෂයේ1,140,433.00 ක මුදලක්ද, 2025 රු.150,000.00 ක මුදලක්ද, මේවනතුරු රුපියල් 6500.00ක්ද 2026 වර්ෂය සඳහා රුපියල් 1,500.00.00 ක්ද ,වශයෙන් ඇස්තමේන්තු කර තියෙනවා.පසුගිය අවුරුදු හා බලන විට 2026 වර්ෂය සඳහා එකවර විශාල මුදලක් වැඩිවෙලා තියෙනවා.මේ සම්බන්ධයෙනුත් පැහැදිලි කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

එසේම ගරු සභාපතිතුමනි , ඔබතුමා විසින් කෙටුම්පත ඉදිරිපත් කලත්,ඔබතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ පිටපතක් අපට ලැබිලා නෑ.නමුත් පසුගිය සභාවල දි නම් අපට ලැබුනා.පසුගිය සභාපතිතුමාත් ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගයක් ලෙස සඳහන් කරමින් සමිති සමාගම් වලට බඩු භාණ්ඩ බෙදා දිමට නොහැකි බව සඳහන් කලා.කෙසේ නමුත් ගම්වල සමිති සමාගම් වල වැඩිපුර ප්‍රමාණයක් තියෙන්නේ ප්‍රාදේශිය සභාව හරහා ලබා දුන් බඩු භාණ්ඩයි.නැවත ගරු ආණ්ඩුකාරතුමාට කතා කර හෝ මෙය වෙනස් කර ගන්නැයි මා ඉල්ලා සිටිනවා.

2026 වර්ෂයේ අයවැය කෙටුම්පත වැලිමඩ ජනතාවට බරක් පැටවෙන කෙටුම්පතක් ලෙස මේ කාරණා තුළින් පෙනි යනවා.මේ නිසා මෙම කෙටුම්පතට පෞද්ගලිකව මා විරුද්ධවනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ධනුෂ්ක තිලකසිරි මැතිතුමා**

ගරු සභාපතිතුමනි,අයවැය යෝජනාව කියන්නේ සම්පත් බෙදා හැරීමක් හෝ අංක විද්‍යාව සමඟ කරන ගණුදෙණුවක් නොවේ. ප්‍රදේශයේ සිටින ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීමට බලපාන සමාජ ,ආර්ථික,දේශපාලනික කරණාවන්ට පිළිතුරක් ලෙස අයවැය ලේඛණය නිර්මාණය කිරීමයි.එසේම අප කෙරෙහි විශ්වාසය තැබූ ජනතාවට ඔවුන් මුහුණ පාන ගැටළුවලට විසඳුමක් ලෙස මෙම අයවැය අප විසින් ඉදිරිපත් කරනු ලැබුවා.එසේම ජන සහභාගිත්ව ආණ්ඩුකරණය යන කාරණයත් සමඟම මෙය ඉදිරිපත් කර ඇති අතර පසුගිය අයවැය යෝජනාවන් හා සංසන්දනය කරන විට මෙහි මන්ත්‍රීවරයාට වැඩි වටිනාකමක් ලබා දෙමින් තමන්ගේ වසම වෙනුවෙන් කටයුතු කිරීමට මන්ත්‍රීවරුන්හට වැඩි මුදල් ප්‍රතිපාදනයක් වෙන් කර දී තියෙනවා.තවද සභාව තුළින් කිරීමට බලාපොරොත්තු වන ස්වයං උත්පාදන ආදායම අයවැය කෙටුම්පතෙහි පිටු අංක 34 හි සටහන් කර තිබෙන අතර එහි වියදම් හා මුළු අදායම් ඒකතුවත්සඳහන් කර තිබෙනවා. තවද, 1987 සිට සභාව ක්‍රියාත්මක වුවාට අපට සභාවට නිශ්චිත ස්ථානයක් පවා වෙන් කිරීමට පසුගිය ආණ්ඩු සමත් වෙලා නෑ. නමුත් අප දේශිය ණය සංවර්ධන අරමුදල සමඟ සභාව නැවත පිළිසකර කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතිනවා.මේ නිසා මෙම අයවැය කෙටුම්පත සභා සම්මත කර ගන්නා ලෙස ඔබ සියලු දෙනාගෙන් මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ඉන්දික සේනාරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමනි,ඉදිරිපත් කර තිබෙන මෙම අයවැය කෙටුම්පතෙහි 32 වන පිටුවෙහි සඳහන් වන සංවර්ධන යෝජනාවන්හි පන්සල් පිළිබඳව කිසිවක් සඳහන් කර නෑ.මේ සඳහා ප්‍රතිපාදන වෙන් විය යුතුයැයි මා සිතනවා.එසේම ධනුෂ්ත මන්ත්‍රීතුමා සභාව පවත්වන්නට නිශ්චිත ස්ථානයක්වත් නොමැති බව සඳහන් කළා.පොළ භූමියට උඩින් අපේ පසුගිය සභාව තිබුන අතර එය 80 ගණන් වල ගිනි තියනු ලැබුවා.එනිසා සභාවක් පැවැත්වීමට ස්ථානයක් නොමැති බව පැවසීම සුදුසු නෑ.එවගේම මෙම ගොඩනැගිල්ල පවා පසුගිය ආණ්ඩු විසින් ඉදිකර තිබෙන්නේ බොහෝ දුෂ්කරතා මධ්‍යයේය.තවද,මෙම අයවැය කෙටුම්පතට ඇතුළත් කර ඇති සංවර්ධන යෝජනා ඉදිරිපත් කල අකාරය පැහැදිලි කරන ලෙස මා ඉල්ලා සිටිනවා.එසේම පන්සල් සඳහා මෙම අයවැයෙන් ස්ථානයක් හිමිනොවීම කෙරෙහි මෙන්ම නිල ඇඳුම් හා පළාත් පාලන සතිය හා විගණනය කිරීම සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන සම්බන්ධයෙන්ද ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රියන්ත චාමින්ද මැතිතුමා**

ගරු සභාපතිතුමනි,පෙර අප සභාව කුළී ගෙවමින් තුෂාර හෝටලයේ පවත්වනු ලැබුවා.එසේම පසුගිය ආණ්ඩුව විසින් ඉදිකල ගොඩනැඟිල්ල තුළයි අප මේ සිටිනුයේ. එම නිසා සභාව තියන්න ස්ථානයක් නෑ කියන කාරණය සඳහන් කිරීම එතරම් සුදුසු නොවේ. සෑම සභාවකම දීම අයවැය කෙටුම්පත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සංශෝධන පවතියි නම් එය ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබාදෙනු ඇත.නමුත් මෙම සභාවේ දි අවස්ථාවක් ලබා දෙන්නේ නැත. 2026 වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති මෙම අයවැය කෙටුම්පතෙහි වැඩිපුර ඇතුළත් කර ඇත්තේ දඩ හා බදු යි.මේ නිසා අයවැය කෙටුම්පත පිළිබඳව ඇත්තේ කළකිරීමකි.තවද මීට පෙර පැවති සභාවලදී සෑම මන්ත්‍රීවරයෙක් සඳහාම JCB යන්ත්‍රය පැය 05ක සඳහා ලබා දුන් අතර පුළුවන් නම් ඒ වරප්‍රසාදය ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තුවාන් කාසීම් මැතිතුමා**

ගරු සභාපතිතුමනි,2026 වර්ෂයේ අයවැය කෙටුම්පත සම්බන්ධව අපේ මන්ත්‍රීවරු ගොඩක් දෙනෙක් අදහස් ප්‍රකාශ කිරීමට සිටියත් රීති අනුව ඒ පිළිබඳව සංශෝධන දින තුනකට කලින් ඉදිරිපත් කළයුතු බව මීට කලින් දැනගෙන නොසිටි බව මා ප්‍රකාශ කර සිටිනවා.අයවැයේ තරුණයන් වෙනුවෙන් කිසිම ප්‍රතිපාදනයක් වෙන්

කර නොමැත.එක් මන්ත්‍රීවරයෙකු වෙනුවෙන් අයවැය කෙටුම්පතේ ලක්ෂ දහයක මුදලක් වෙන් කර තිබුණත් මා රාජ්‍ය නොවන සංවිධාන ( NGO) වල වැඩ කරන විට ලක්ෂ දහයට වැඩිය ලබා ගෙන ඇති බව සඳහන් කරනවා.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනි චන්ද්‍රිකා තෙන්නකෝන් මැතිනිය**

ගරු සභාපතිතුමනි,එක් මන්ත්‍රීවරයෙක් සඳහා රුපියල් 1,000,000.00 ක මුදලක් වෙන් කිරිම සම්බන්ධයෙන් මා අගය කරන අතර ඔබතුමා සඳහන් කල පරිදි රීතී අනුව කටයුතු කරගෙන යාමේ දි ගැටළු පැන නඟිනවා.එසේම මීට අවුරුදු කිහිපයකට පෙර සභාව පැවතියේ තුෂාර හෝටලයේ වන අතර එහි දි මාසිකව කුලියක්ද ගෙවනු ලැබුවා.පසුව සභාව මෙම ස්ථානයට ගෙන ඒමත් සමඟ ඒ සඳහා වැය වන මුදලද ඉතිරි කිරිමට අපට හැකි වුණා. තවද වැලිමඩ ප්‍රාදේශිය සභාව ලෙස සමිතිවලට මීට පෙර පැවති සභාවල සිටි මන්ත්‍රිවරුන්ට ප්‍රතිපාදන ලබාදුන් බැවින්,මේ සභාවේද ලබාදෙන ලෙස ඔබතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. අතර අයවැය කෙටුම්පතෙහි සඳහන් සංවර්ධන යෝජනා ලබා ගත්තේ කුමන ආකාරයෙන්ද යන්නත් පැහැදිලි කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනි සෝමසිරි බණ්ඩාර මැතිතුමා**

ගරු සභාපතිතුමනි, පසුගිය දිනක පැවති නවක මන්ත්‍රිවරුන් සඳහා පැවති පුහුණු වැඩසටහන තුළින් අපට සභා රීති පිලිබඳව දැන ගැනිමට ලැබුණා.මෙතෙක් අපි රීති පිලිබඳව දැනුවත්ව සිටියේ නැත.මේ නිසා අයවැය කෙටුම්පත සම්බන්ධව ක්‍රියාමාර්ග ගැනිමට නොහැකි විය.එබැවින්, රීති පත්‍රිකා අපට ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.එසේම පසුගිය සභාවේ සිටි සභාපති විසින් ගම්වල ඇති සමාගම්වලට අපට ලැබෙන ප්‍රතිපාදන හරහා කටයුතු කිරිමට අවස්ථාව සලසා දුන්නා. ගම්වල සංවර්ධන වැඩ සටහන් සඳහා මධ්‍යම රජයෙන් හා පළාත් සභාවෙන් ප්‍රතිපාදන ලැබෙන බැවින්,අපට ලබාදෙන රුපියල් 1,000,000.00 ක මුදල ගම්වල සමිති සමාගම්වල කටයුතු සඳහා යොදා ගැනිමට අවස්ථාව ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අජිත් ප්‍රේමලාල් මැතිතුමා**

ගරු සභාපතිතුමනි,පසුගිය ආණ්ඩුවේදි මා ප්‍රාදේශිය සභා මන්ත්‍රිවරයෙක් ලෙස සිට ගම්වල ජනතාවට හා පදික වෙළඳුන්හට විශාල කැප කිරිමක් කර ඔවුන් වෙනුවෙන් සේවය කරනු ලැබුවා.නමුත් මේ සභාවට පත් කිරිමටවත් ඔවුන් ඡන්දය ලබා දුන්නේ නැත .එබැවින්,ගම්වලට සේවය කිරිමට ප්‍රතිපාදන ලබා දුන්නත් නොදුන්නත් මට ප්‍රශ්නයක් නැත. එසේම මෙම කෙටුම්පතෙහි පදික කඩ පිලිබඳව කිසිවක් සඳහන් වී නොමැති විම සම්බන්ධයෙන් මාගේ කණගාටුව ප්‍රකාශ කර සිටිනවා.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ආර්.එම්.මහේෂ් කෝසල රාජකරුණා මැතිතුමා**

ගරු සභාපතිතුමනි, දැන් රටේ අනවශ්‍ය වියදම් සීමා කර රට නිවැරදි මාවතකට යොමු වෙලා තියෙනවා. රට වගේම වැලිමඩ ප්‍රාදේශීය සභාවත් එසේ නිවැරදි මඟකට යොමු වෙලා තියෙනවා.මෙම අයවැය කෙටුම්පත තුළින් වැලිමඩ ප්‍රදේශයේ ජනතාවට සේවය කිරිමට මන්ත්‍රිවරුන් සඳහා කෝටි හතර හමාරක මුදලක් වෙන් වෙලා තියෙනවා. එසේම කෙටුම්පතේ සඳහන් වන ආකාරයට සංවර්ධන යෝජනා 98 වෙනම ක්‍රියාත්මක වන අතර මන්ත්‍රිවරුන්ට ලැබෙන ප්‍රතිපාදන හරහා අපට සංවර්ධන ව්‍යාපෘති 44 ක් ක්‍රියාත්මක කල හැකිය.මේ සංවර්ධන යෝජනා 98 තුලින් සෑම වසමක්ම නියෝජනය වන පරිදි සකස් කර ඇත. වැලිමඩ නගරය සංවර්ධනය කිරිම උදෙසා සාර්ථක සැලසුම් මෙම කෙටුම්පත තුලින් ඉදිරිපත් කර තිබෙන අතර විශේෂයෙන් වැලිමඩ නගරයේ රථ වාහන ගාල් කිරිම සඳහා ස්ථානයක් ස්ථාපිත කිරිමටත්,සභාව වෙනත් ස්ථානයක් තුළ ස්ථාපිත කිරිමටත්,පොළ භූමිය සංවර්ධනය කිරිමටත්, යෝජනා වි ඇත. එබැවින් මෙම කෙටුම්පත නිවැරදිව, අවබෝධයෙන් යුතුව කියවා පැහැදිලි කර ගන්නේ නම් 2026 වර්ෂයේ අයවැය කෙටුම්පතට කිසිවකුට විරුද්ධ විය නොහැකිය.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනි චිත්‍රා පතිරණ මැතිනිය**

ගරු සභාපතිතුමනි, අප මෙම අවස්ථාවේ දි අය වැය කෙටුම්පත සම්බන්ධයෙන් ගත යුතු දේ හා ඒ තුළ ඇති සංවර්ධන යෝජනා මොනවාද යන්න සම්බන්ධයෙත් අවධානය යොමු කල යුතුය.එසේම වැලිමඩ ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රිවරියන් ලෙස අප පවතින නීතීයට යටත්ය. නීතිය පිළිබද දැනුවත් නැත කියන කරුණ අදාළ නොවන අතර නීති පිළිබද ගැටළු පවතිනම් අප ඒවා කතා කල යුතුය.‘‘පොහොසත් රටක් ලස්සන ජීවිතයක් ’’යන පාඨය අරමුණු කරගෙන අපි රටේ ඉදිරි ගමන සැලසුම් කර තිබෙනවා.එසේම මන්ත්‍රිවරියන් 10 දෙනෙකු මෙම සභාව නියෝජනය කරනු ලබන අතර කාන්තාවන් වන අපට දරුවන්ගේ වගකිමද පැවරෙනවා. මේ නිසා මෙම අයවැය කෙටුම්පත තුළින් දරුවන් වෙනුවෙන් සංවර්ධන යෝජනා රැසක් ඉදිරිපත් වි තිබෙන බව යෝජනා අංක 3, 44, 62, 80 හා 82 යන යෝජනා තුළින් පැහැදිලි වෙන බව මා පවසා සිටිනවා.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.සිසිර දිලාන් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමනි,2026 අයවැය කෙටුම්පත පිළිබඳව ඔබතුමන්ලාගේ අදහස්වලින් ප්‍රකාශ වන්නේ ජාතික ජනබලවේගයේ අයවැයදැයි මට සිතෙනවා.මෙම අයවැය යෝජනා අනුඅට තුළ අප දැනට පවත්වාගෙන යනු ලබන්නේ අපට අයත් ස්ථානයක නොවන බැවින් එය සෑදිම පිළිබඳව යෝජනාවවත් මෙම කෙටුම්පතට ඇතුළත් කර නොමැති බව මා පවසා සිටිනවා.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.කරුණාරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමනි,වැලිමඩ ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂයේ අයවැය ලේඛනයට අදාළව ග්‍රාම නිලධාරි වසම් 64 ම සහ උප කාර්යාල හතරම නියෝජනය වන ආකාරයට සැලකිය යුතු අවධානයකින් මේ අයවැය සම්පාදනය කර ඇත. පසුගිය මහ සභාවේ මන්ත්‍රීවරුන් අදහස් දැක්වීමේදී ජාතික ජනබල වේගයේ මන්ත්‍රීවරුන් හැර අනෙකුත් බොහෝ මන්ත්‍රීවරුන් විසින් පෞද්ගලිකව මුදල් වෙන් නොකිරීම සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කරනු ලැබුවා.ඒ අනුව ගරු සභාපතිතුමා විසින් අයවැය කෙටුම්පතේ පළමු යෝජනාව ලෙස එක් එක් සභිකයකු සඳහා ලක්ෂ 10ක මුදලක් වෙන් කර තිබෙනවා.

මීට පෙර ආණ්ඩුවල සභාපති වරුන් විසින් අපි මන්ත්‍රීවරුන් වුවාට අපිට ප්‍රතිපාදන ලබා නොදුන් අඅවස්ථාවන් තිබුණා..මේ කරුණු කාරණා පිළිබඳව රුපියල් ශතත් ඒක්ක මනින්න ඒපා කියා මා ඉල්ලා සිටින අතර පක්ෂ පාට නැතිව භේද අමතක කර වැලිමඩ ජනතාව වෙනුවෙන් සේවය කරමු යැයි මා සියළුම මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනි ඩබ්.චාමලී තුෂාරිකා මැතිනිය**

ගරු සභාපතිතුමනි,සභාපතිවරයාගේ දැක්ම සභාගත කරන අවස්ථාවේදී 2026 වර්ෂයේ වැලිමඩ ජනතාවගේ ජීවිතය ලස්සන කිරීම සඳහා කුමන ආකාරයට මැදිහත් වීමට එතුමා අපේක්ෂා කරනවාද සහ සභිකයින්ගෙන් කුමන ආකාරයේ සහයෝගයක් අපේක්ෂා කරනවාද කියන කාරණය පැහැදිලි වුණා. මෙම අයවැය මහජන සුභසාධනවාදී අයවැයක්ය.එසේම .සමහර සභිකයන් විසින් ජාතික ජනබලවේගයේ අයවැය ලෙස මෙම අයවැය හඳුන්වනු ලැබුවා. අයවැය කෙටුම්පතේ 32 පිටුවේ ප්‍රාග්ධන යෝජනා යටතේ යෝජනා 98 ක් සඳහන් වෙන අතර එහි පළමු යෝජනාව ලෙස මන්ත්‍රීවරුන් 44 දෙනාට ලක්ෂ 10 ක මුදලක් ද වෙන් වන අතර ග්‍රාම නිලධාරි වසම් 64 තුළට බෙදී යන ආකාරයට අයවැය යෝජනා සකස් කර තියෙනවා.2025.09.25 වන දින පැවත්වූ මහ සභාවේ මන්ත්‍රීවරුන්ගේ අදහස් දැක්වීමේදී මන්ත්‍රීවරු විශාල ප්‍රමාණයක් පෞද්ගලිකව මුදල් වෙන් නොකිරීම පිළිබඳව අදහස් ඉදිරිපත් කලා.ඒ අවස්ථාවේදී ගරු සභාපතිතුමා විසින් කොට්ඨාශයට මුදල් වෙන් කරනවා නම් වැඩිපුර මුදල් වෙන් කිරීමට හැකියාව පවතින බවත්, පෞද්ගලිකව මන්ත්‍රීවරුන් තනි

තනිව ඉල්ලනවා නම් එක ලොකු වැඩක් කර ගැනීමට අවස්ථාව නොලැබෙන බවත් පැවසුවා.ඒත් බොහෝ මන්ත්‍රීවරුන් පෞද්ගලිකව තමන්ට අවශ්‍ය බව පැවසූබැවින්,එම ඉල්ලීම අනුව අයවැය කෙටුම්පතේ පළමු යෝජනාව ලෙස එක් සභිකයකු සඳහා ලක්ෂ 10ක මුදලක් වෙන් කර ඇත.ඒ නිසා කිසිකෙනෙකුට ඔබලාගේ මතයට අපි ඇහුම්කන් නොදුන් බව පැවසිය නොහැකිය..අයවැය කෙටුම්පතට අමතරව සභාපතිතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශයේද යෝජනා රාශියක් ඉදිරිපත් කර ඇති බැවින් ඒ සියල්ල ක්‍රියාවට නැංවීමට සහය ලබා දෙමු කියා මා පවසා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි නිලූකා කුසුම් කුමාරි මැතිනිය**

ගරු සභාපතිතුමනි, 2018 වර්ෂයේ සභාව නියෝජනය කල මන්ත්‍රිවරියක් ලෙස මෙම අයවැය කෙටුම්පත නිරික්ෂණය කිරිම තුළින් පෙනි යන කරුණක් වන්නේ වැලිමඩ ප්‍රදේශයේ ජනතාවට සේවය කිරිමට හැකි අකාරයට සකස් කර ඇති අයවැය කෙටුම්පතක් බවයි. මෙම අයවැය කෝටි 44 කට සකස් වි ඇති අතර එහි දි ස්වයං උත්පාදන ආදායම වැඩි කර ගන්නා ආකාරය පැහැදිලි කර තිබෙනවා.සභාපතිතුමා අත්තනෝමතිකව කටයුතු කරන බව පැවසුවත්,එය එසේ නොවන බව එක් එක් මන්ත්‍රිවරුන්හට ප්‍රතිපාදන වෙන් කිරිම තුලින් පැහැදිලි වේ.එසේ වෙන් කරන ප්‍රතිපාදන තුළින් සභා විෂය පථයට අදාළ කාර්යයන් පමණක් ඉටු කිරිමට අප කටයුතු කල යුතුය. එසේම පසුගිය ආණ්ඩු හරහා ලක්ෂ 02 ක මුදලක් ලබා දුන් අතර එහිදි සංවර්ධන ව්‍යාපෘති කල නොහැකි නිසා සමිති සමාගම් වලට බඩු භාණ්ඩ ලබා දි ඇත. මේ නිසා මෙම ලක්ෂ 10ක මුදල ගමේ සංවර්ධන වැඩ වලට යොදවන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ඩී.පි.ඥාණපාල සේනාධිර මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මා මුලින්ම සභාපතිතුමාගේ මංගල අයවැය ඉදිරිපත් කිරිම සම්බන්ධයෙන් සුභාශිංසන පිරිනමනවා.එසේම සභාපතිතුමා විසින් අනවශ්‍ය වියදම් සිමා කර කටයුතු කරන බව අපට පැහැදිලිවනවා.මන්ත්‍රිවරුන් බොහෝ දෙනෙක් සමිති සමාගම්වලට බඩු ලබා දිම සම්බන්ධයෙන් අදහස් දැක්වුවා.නමුත් ප්‍රාදේශිය සභාව පටන් ගත් දිනයේ සිට අද දක්වාම සමිතිවලට බඩු ලබා දුන් අතර මෙයින් අප මිදිය යුතුය.අපගේ අරමුණ විය යුත්තේ ජනතාව ආර්ථික,සංස්කෘතික සමාජයක් වශයෙන් ඉදිරියට ගෙනයාමයි.අප අයවැය සකස් කරනු ලැබුයේද මෙම අරමුණ පෙරදැරි කරගෙනය.
තවද වාහන ගාල් කිරිමට රථ ගාලක් හා සභාව පැවැත්විමට ස්ථානයක් නැතිබව ප්‍රකාශ කලා.මෙම අයවැය තුලින් හේමපාල මුනිදාස මාවතේ සභාවට අයත් බිම් කොටස තුළ මහල් පහකින් යුතු ගොඩනැගිල්ලක් ඉදි කිරිමටත්, එහි යට තට්ටුවේ වාහන නතර කර තැබිමටත්,දෙවන මහළේ වෙළඳ සංකීර්ණය සැදිමටත්,තුන්වන මහළේ සභා කාර්යාලය සැදිමටත්,යෝජනා කර ඇත.එසේම සභාපති ලෙස පළාත් සභාවත් ,මධ්‍යම ආණ්ඩුවත් සමග එකතු වි වැලිමඩ ජනතාවගේ ගැටළු විසදිම සඳහා යෝජනා 98 ක් සකස් කර තිබෙනවා.සමස්ථයක් ලෙස ගත්කල වැලිමඩ ජනතාවට වංචා දූෂණයෙන් තොර අයවැයක් ඉදිරිපත් කර ඇති බව මා ප්‍රකාශ කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි තාහීර් මහාරූෆ් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ජනතාව අපට ඡන්දය ලබා දි අපි ඔවුන්ගේ ගමට සේවයක් කරයි කියන බලාපොරොත්තුවෙන් සිටිනවා. එම නිසා රුපියල් 1,000,000.00 ක මුදල මට නම් අවශ්‍යයි.මේ මුදල සඳහා සධාරණ යෝජනා ඉදිරියේ දි මම සභාවට ඉදිරිපත් කිරිමට අපේක්ෂා කරනු ලබනවා.ඒසේම අයවැය කෙටුම්පතෙහි 49 වනි පිටුවෙහි නිල ඇඳුම් දීමනාව රුපියල් 12,000.00 සිට රුපියල් 180,000.00 දක්වා වැඩි වෙලා තියෙනවා.එසේ වැඩි විමට හේතුව කවරක්දැයි යන්නත්,පිටු අංක 50 හි මන්ත්‍රි යන්න සඳහන් කර ඇති ස්ථානයේ දූරකථන දිමනා ලෙස රුපියල් 700,000.00 ක මුදලක් වෙන් කර තිබෙන අතර මේ පිලිබඳවත් පහැදිලි කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි එන්.එම්.කරුණාදාස මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, 2026 වර්ෂයේ අයවැය කෙටුම්පත සකස් කිරිම සඳහා කැප වු කාර්ය මණ්ඩලයට මා මුලින්ම ස්තුතිවන්ත වනවා.එසේම මහජනතාව අපව සභාවට තෝරා පත් කර එවිම තුළින් අප සියලු දෙනාටම විශාල වගකිමක් ලබා දි තියෙනවා.මේ නිසා ගමට සේවයක් අප කල යුතුය.තවද,අයවැය කෙටුම්පතේ වැය ශිර්ෂ 06 ක් යටතේ විවිධ කාර්යයන් පිළිබඳව සඳහන් කරලා තියෙනවා. එසේම සංවර්ධන යෝජනා 98 ක් ඉදිරිපත් කරමින් බලාපොරොත්තු වන්නේද ගමට සේවයක් කිරිමයි.මේ නිසා 2026 අයවැය කෙටුම්පත හොඳ වැඩපිළිවෙලක් කියා මා හිතනවා

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනි සිත්ති හුසෙයිමා මැතිනිය**

ගරු සභාපතිතුමනි,පළමු අයවැය කෙටුම්පත ඉදිරිපත් කරන බැවින්,අද දින සුවිශේෂි සභාවක් වනවා.මෙම කෙටුම්පත තුළින් වැඩි වශයෙන්ම සඳහන් කර ඇත්තේ වරිපනම් බදු, කුළි,බලපත්‍ර ගාස්තු අය කිරිම වැනි දෑය.වැලිමඩ ජනතාවගේ ආදායම වැඩි කිරිම සම්බන්ධ වු යෝජනා කිසිවක් මෙහි ඉදිරිපත් කර නැත.එසේම කාන්තාවන් වෙනුවෙන් යම් වැඩපිළිවෙලක් සකස් කරන ලෙස ද මා ඉල්ලා සිටින අතර ගම්වල තරුණ පිරිස විදේශගත වන ප්‍රවණතාව වැඩිවෙලා තියෙනවා.මේ නිසා සභාව මඟින් ඔවුන්ට යම් වැඩපිළිවෙලත් සකස් කිරිම සුදුසු බවට මා සිතනවා.මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශිය සභා සභාපති ඩී.එම්.අජිත් කුමාර දිසානායක මැතිතුමා**

2026 වර්ෂයේ අයවැය කෙටුම්පත සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමන්ලා,තුමියන්ලා බොහෝ දෙනෙකු විසින් අදහස් ඉදිරිපත් කරනු ලැබුවා.මෙහි දි සංවර්ධන යෝජනා සම්බන්ධයෙන් බොහෝ දෙනෙක් අදහස් දැක්වුවා.ගරු මන්ත්‍රිතුමනි,තුමියනි, පළාත් නිශ්චිත අරමුදලින් ( PSDG) හා උපමාන පාදක විමධ්‍යගත අරමුදල් හරහා වෙන් වන ප්‍රතිපාදන ඇතුළුව සියලු ප්‍රතිපාදන අපට පළාත් සභාවෙන් පන්කෝටි පන්ලක්ෂයක් වෙන් වෙලා ඇති අතර මෙකි ප්‍රතිපාදන තුළින් කෙටුම්පතෙහි ඇති සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරිමට නියමිතය.එම මුදලට ගැලපෙන අකාරයට 2026 වර්ෂය සඳහා ප්‍රජාවගෙන් ලැබුණු යෝජනා ප්‍රාදේශීය සභාවේ සංවර්ධන යෝජනා ලැයිස්තුවක් ඇති අතර එහි දි ප්‍රමුඛතාවය මත හැම ග්‍රාමසේවා වසමකටම අසාධාරණයක් නොවන පරිදි මෙම යෝජනා 98 ට සකස් කර ඇත.

ප්‍රභාත් මන්ත්‍රීතුමා විසින් ප්‍රතිපාදන ලබා දුන්නට සතුටු නැති බව පැවසීය.ගරු මන්ත්‍රීතුමනි ඔබතුමා විසින් එය තීරණය කල යුතුයි. ලියනගේ මන්ත්‍රීතුමා විසින් JCB යන්ත්‍රය ලබාදෙනවාද යන්න සම්බන්ධයෙන් කතා කලා.මෙහිදි ගරු මන්ත්‍රීතුමනි,අප සභාව භාරගන්නා විටත්,මෙම යන්ත්‍රය කැඩි තිබුන අතර මෙය පසුව අළුත්වැඩියා කටයුතු සිදු කලත් නැවත එය අබලන් වි ඇත.මෙය නඩත්තු කල නොහැකි ආකාරයට අබලන් වෙලා තියෙනවා. මේ නිසා සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරිමට JCB යන්ත්‍රය අවශ්‍ය වි ඇතත් ඒ සඳහා මෙය යොදා ගැනිමට නොහැකි වෙලා තියෙනවා.එසේම සභා කාර්යාලය තිබෙන ස්ථානය පිළිබඳවත් කතා කලා.මන්ත්‍රීතුමනි මේ සභාව තියෙන තැන හොඳ නැති අදහසක් නෙවෙයි ඉදිරිපත් කරනු ලැබුයේ.විශේෂයෙන් පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් ඇගයිම් තරඟාවලියක් පවත්වනු ලබන අතර බදුල්ල දිස්ත්‍රික්කයෙන් තේරුණු සභා අතරින් අප සභාව දෙවෙනි ස්ථානයට පත්වුණා.මෙහි දි මේ තරඟාවලිය ඇගයිම් කිරිමට පැමිණි නිලධාරින් විසින් යොමු කල ප්‍රධාන කාරණාව වන්නේ සභාව තියෙන ස්ථානය පිළිබඳ හැඟිමක් ඇති නොවන බව හා පෙරටු කාර්යාල සංකල්පය ස්ථාපිත කල විට මෙහි සේවය ලබා ගැනිමට පැමිණෙන මහජනතාවට පහසුවෙන් තම කටයුත්ත කල හැකි පරිදි ඊට උචිත අයුරින් කාර්යාලයක් ඉදි කිරිමට අවශ්‍ය බවයි.මෙකි අරමුණු පෙරදැරි කරගෙන මෙම ස්ථානයෙන් වෙන ස්ථානයකට සභාව ගෙන යාමට සැලසුම් කරනු ලැබුවා.

ඒවගේම සම්පත් මන්ත්‍රිතුමා මුද්දර ගාස්තු සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කරනු ලැබුවා.ගරු මනත්‍රිතුමනි මේ සම්බන්ධයෙන් පුරෝකතනයක් තමයි අප සිදු කරනු ලබන්නේ.අපට මුද්දර ගාස්තු ලෙස පළාත් සභාවෙන්

මේ බල ප්‍රෙද්ශය තුළ වැයවන මුද්දර ගාස්තු ප්‍රාදේශීය සභාවට එවනු ලබනවා.ගියවර සියලුම පළාත් පාලන ආයතනවලට මුද්දර ගාස්තු වැඩි වී තිබුන අතර හරක්ගම කන්ද ඉඩම විකිණීම හේතුවෙන් සැලකිය යුතු මුද්දර ගාස්තු ප්‍රමාණයත් අපට ලැබී තිබීම හේතුවෙන් මුද්දර ගාස්තු වැඩි වී ඇති බව පෙනෙනවා.අයවැය ලේඛණයට ඉදිරිපත් කරනු ලබනුයේ උපකල්පනයක් පමණකි. තවද ඝෝගාතාකාගාර සම්බන්ධයෙන්ද ඉන්දික මන්ත්‍රිතුමා විසින් අදහස් දැක්වුවා.ස්ථිර ඝෝගාතකාගාර බලපත්‍ර අපට නොතිබුණු අතර තාවතකාලික ඝෝගාතකාගාර තිබුණු අතර ඒවා දින දාහතරෙන් දාහතරට අලුත් කරමින් යනවා.විගණනය විසින් ස්ථිර ඝෝගාතකාගාර නොමැති වීම සම්බන්ධයෙන් නිතර විමසන බැවින්,සියලුම මස් කඩ හිමියන් ස්ථිර ඝෝගාතකාගාර ඉදිකර ඇත.මේ හේතුවෙන් බලපත්‍ර ගාස්තු අඩු වී ඇත.ප්‍රචාරක පුවරු සම්බන්ධ කාරණයේ දි අප සභාවට අය කර ගත යුතු ආදායමක් අහිමි වෙමින් පැවති අතර සියලු වෙළඳසැල් හා සියලුම අයතන සඳහා ප්‍රධාන පුවරු හැර අනෙතුක් පුවරු සියල්ලටම අතරු ව්‍යවස්ථාවක් සම්මත කර ඇති අතර ඒ අනුව අදාල ගාස්තු අයකර ගනු ලබනවා.එසේම ලබන වර්ෂයේ සිට MOBITAL සමාගම සමඟ හා වත්මන් රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන CLEAN SRI LANKA සංකල්ප තුළින් වැලිමඩ නගරයේ දැන්වීම් පත්‍රිකා වෙනුවට ඩිජිටල් ආකෘතියට දැන්වීම් ප්‍රදර්ශනය කිරිමට මේවන විට සාකච්ඡා සිදු කරමින් පවතිනවා.

තවද වැසිකිලි ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කරනු ලබුවා.මෙහි දි අයවැය රීති ප්‍රකාරව අප කටයුතු කරනු ලැබු අතර ආදායම් උත්පාදන ක්‍රම සම්බන්ධයෙන් අප මුදල් කමිටුව වෙත මෙම වාර්තාව ඉදිරිපත් කරනු ලැබුවා.මුදල් කමිටුව සියලු පක්ෂ නියෝජනය කරන ලබනු අතර කමිටුව විසින් මෙම වාර්තාව නිර්දේශ කිරිමෙන් අනතුරුව සභාව ට යෝජනාවක් ලෙස ඉදිරිපත් කිරිමෙන් අනතුරුව මෙය සියලු මන්ත්‍රිවරුන් විසින් ඒකමතිකව සම්මත කරනු ලැබුවා.ඒ සම්මත කරනු ලැබූ අදායම් උත්පාද ක්‍රම තුලින් මෙම අයවැය ලේඛනය සම්පාදනය කරනු ලැබිය.එසේම පාසල් ළමුන් හා පූජ්‍ය පක්ෂය සඳහා නොමිලේ වැසිකිළිය පාවිච්චි කිරිමට අවස්ථාව සලසා දි තියෙනවා.

නිල ඇඳුම් සම්බන්ධව මන්ත්‍රිවරුන් කිහිප දෙනෙක්ම අදහස් ඉදිරිපත් කරනු ලැබුවා.පනතේ සඳහන් වී තියෙන්නේ ඒ අදාළ කාර්යයන් සඳහා ඒ අයට නිල ඇඳුම් සම්පාදනය කළ යුතු බවයි.ඒ නිල ඇඳුම් සම්පාදනයේදී රියදුරන්,මුරකරුවන්,කාර්යාල කාර්ය සහායකයන්,ආදායම් පරීක්ෂකවරුන් යන අය සඳහා නිල ඇඳුම් සැපයිය යුතු වුවත් එය මෙතෙක් සිදු වී නොමැති අතර මින් ඉදිරියට දිගටම ක්‍රියාත්මක කිරිමට අප කටයුතු කරනවා. තවද, මන්ත්‍රී දුරකථන දීමනාව සම්බන්ධව කථා කළා.ගරු මන්ත්‍රිතුමනි,සභාවට යෝජනාවක් ගෙනවිත් සම්මත කරගත් පසු එම දුරකථන දීමනා ගෙවීමට මුදල් වෙන් කර ඇත.

එසේම පළාත් පාලන සතියට ලක්ෂ 15ක් වෙන් කර ඇති බව පැවසුවා.පළාත් පාලන සතිය පසුගිය ආණ්ඩු කාලයේ පැවතියත් එය ක්‍රියාත්මක වී නොමැත.පළාත් පාලන සතිය යනු පළාත් පාලන ආයතනයකින් බල ප්‍රදේශයේ ජනතාවට සෘජුවම මැදිහත් වෙලා ඒ අදාළ කාර්යභාරය කරන්න පුළුවන් සතියකටය.මෙය අපෙ ආණ්ඩුව විසින් දිගටම ක්‍රියාත්මක කරන බැවින් ඒ සඳහා මුදල් වෙන් කර ඇත.ඒ වෙන් කළ මුදල මුදල් කමිටුවට හා මහ සභාවට ඉදිරිපත් කිරිමෙන් අනතුරුව සම්මත කරගනු ලබුවා. එදි දි සමමත කරගත් මුදලටත් වඩා අඩු මුදලකින් එය කර ගැනීමට හැකිවුණා.විගණනය සෑම වර්ෂයක් තුළම සිදුවන බැවින්, ඒ නිලධාරින්ට ගෙවීම් කිරීම සඳහා මුදල් වෙන් කර ඇත.එසේම ප්‍රතිපත්ති ප්‍රකාශය ලබා නොදුන් බව ප්‍රකාශ කලා.මන්ත්‍රිතුමනි,මෙම කෙටුම්පත සභාවේ සම්මත වූ පසු ප්‍රතිපත්ති ප්‍රකාශය අයවැය වාර්තාව සමඟ ඔබට ඉදිරිපත් කරනවා.

ඊළඟට ඉන්දික සේනාරත්න මන්ත්‍රිතුමා විසින් ද අදහස් ඉදිරිපත් කරනු ලැබුවා.මන්ත්‍රීතුමනි 1988,1989 යන කාල පිළිබඳව දැන ගැනීමට නම් ලබන සභා වාරය සඳහා කල් දී ඇති යෝජනාවක් ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

තවද, තුවාන් කාසීම් මන්ත්‍රිතුමා තරුණ අයට ප්‍රතිපාදන වෙන් කර නැති බව පැවසු අතර මිළඟ අවුරුදු 04 ක කාලය තුළ ඒ සඳහා මැදිහත් වීමට කටයුතු කරනවා. NGO (රාජ්‍ය නොවන සංවිධාන) ආයතන වලින් ඔබට ප්‍රතිපාදන මීට වඩා ලැබුණු බව පැවසුවා. ප්‍රාදේශීය සභාව සහ NGO ආයතනය ආයතන දෙකක් බැවින් එය එසේ විය හැකිය.

සෝමසිරි බණ්ඩාර මන්ත්‍රීතුමා පසුගිය 2025.10.28 වන දින පැවති වැඩමුළුව තුල දි රීති පිළිබඳව දැනගන්නට ලැබුණු බව පැවසුවා.ඉදිරියේදී පැවැත්වෙන වැඩසටහන් සඳහා සහභාගි වන ලෙස හා ඔබතුමාගේ පක්ෂයටද මෙවැනි වැඩ සටහන් සංවිධානය කරන ලෙස ඉල්ලා සිටින ලෙස මා පවසනවා.

ඊළඟට අජිත් මන්ත්‍රීතුමා පදික කඩ පිළිබඳව අදහස් ඉදිරිපත් කරනු ලැබුවා. මේ සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය පැත්තෙන් විරෝධතා මතු වී ඇති අතර ඒ විරෝධතා නොසලකා සභාව මැදිහත් වී කටයුතු කිරීමට යොමු වුවත් කඩ හිමියන්ගේ පැත්තෙන් ඔවුන්ගේ නම්‍යශීලිබවක් දක්වන්නේ නැති බව පෙනෙනවා.

ඊළඟට චිත්‍රා පතිරණ,මහේෂ් කෝසල,යන මන්ත්‍රීවරුන් විසින් අදහස් දැක්වූවා. ඒ අයටද මාගේ ස්තූතිය පුදකර සිටිනවා.

සිසිර දිලාන් මන්ත්‍රීතුමා ,ආණ්ඩුවේ ප්‍රතිපත්ති මත පිහිටා අයවැය කෙටුම්පත සකසා ඇති බව පැවසුවා. එම මාර්ගෝපදේශවලට අනුව කෙටුම්පත සකස් වී ඇති බව මා පවසනවා.

ඊළඟට නිලූකා කුසුම් කුමාරි,ඥානපාල සේනාධීර,එච්.එම්.කරුණාරත්න යන මන්ත්‍රීතවරුන් විසින් ද අදහස් ප්‍රකාශ කලා.එම මන්ත්‍රීතවරුන්හටද ස්තූතිවන්ත වෙනවා.

ඊළඟට හුසෙයිමා මන්ත්‍රීතුමිය කාන්තාවන් සඳහා වැඩසටහන් කිරීම පිළිබඳව කථා කළා.ඒ සඳහා ඉදිරියේදී මැදිහත්වීමට කටයුතු කරනවා.

අනතුරුව ගරු සභාපතිතුමන් විසින් අයවැය සම්මත කර ගැනීම සඳහා බෙදීමක් අවශය නම් එය යෝජනා කර අයවැය සම්මත කර ගන්නා ලෙස ඉල්ලා සිටින ලදි.

**ගරු ප්‍රභාත් රවීන්ද්‍ර මන්ත්‍රීතුමා** විසින් 2026 වර්ෂයේ අයවැය සම්මත කර ගැනීම සඳහා බෙදීමක් අවශ්‍ය බව යෝජනා කරන ලද අතර **ගරු ප්‍රියන්ත චාමින්ද මන්ත්‍රීතුමා** විසින් ස්ථිර කරන ලදි.

ඒ අනුව පහත සඳහන් පරිදි ලේකම්තුමා විසින් ඡන්දය සටහන් කරගන්නා ලදි.

| අ.අ | නම | **පක්ෂ** | **විපක්ෂ** | **ඡන්දය දීමෙන් වැළකි සිට** | **ඡන්දය ප්‍රකාශ කරන අවස්ථාවේ දි නොසිටි** |
|---|---|---|---|---|---|
| 1 | ඩී.එම්.අජිත් කුමාර දිසානායක මයා | ✓ | | | |
| 2 | එම්.එල්.එම්.සෆ්වාන් මයා | ✓ | | | |
| 3 | ජේ.එම්.ඉන්දික සම්පත් මයා | | ✓ | | |
| 4 | එල්.එම්.ප්‍රභාත් රවීන්ද්‍ර ගුණසේකරමයා | | ✓ | | |
| 5 | එච්.එම්.කරුණාරත්න හේරත් මයා | ✓ | | | |
| 6 | එම්.එම්.දයාරත්න මයා | | ✓ | | |
| 7 | එච්.වි.නිලූකා කුසුම් කුමාරි මිය | ✓ | | | |
| 8 | මොහොමඩ් අලීම් මොහොමඩ් ෆායිස් සයිබු මයා | | ✓ | | |
| 9 | ඩබ්.එම්.අජිත් ප්‍රේමලාල් මයා | | ✓ | | |
| 10 | ටී.එම්.චන්ද්‍රිකා තෙන්නකෝන් මිය | | ✓ | | |
| 11 | එල්.ඒ.ප්‍රියන්ත චාමින්ද මයා | | ✓ | | |
| 12 | ආර්.එම්.මහේෂ් කෝසල රාජකරුණා මයා | ✓ | | | |
| 13 | ආර්.එම්.සරත් කුමාර රාජපක්ෂ මයා | ✓ | | | |
| 14 | ආර්.එම්.ඩී.අයි.රන්දෙනිය මයා | ✓ | | | |
| 15 | ඊ.චන්දක වීරසේන මයා | ✓ | | | |
| 16 | ටී.කේ ලලිත් පදිමසිරි විජයනන්ද මයා | ✓ | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 17 | එස්.උදයකුමාර් මයා | ✓ | | | |
| 18 | ජේ.පි.චිත්‍රා ජයසිංහ පතිරණ මිය | ✓ | | | |
| 19 | එම්.එම්.පි.ජමිත් මයා | ✓ | | | |
| 20 | ඩබ්.සි.තුෂාරිකා ප්‍රනාන්දු මිය | ✓ | | | |
| 21 | ජී..ධනුෂ්ක තිලකසිරි මයා | ✓ | | | |
| 22 | ඊ.ඩෙන්සිල්.ස්ලේඩන් මයා | ✓ | | | |
| 23 | ආර්.එම්.චන්ද්‍රසේකර මයා | ✓ | | | |
| 24 | එන්.එම්.කරුණාදාස මයා | ✓ | | | |
| 25 | කේ.එම්.චාමර ප්‍රසාද් ගුණසේකර මයා | ✓ | | | |
| 26 | එස්.එම්.රාසික් මයා | ✓ | | | |
| 27 | ඒ.එම්.හුසෙයින් මයා | ✓ | | | |
| 28 | ඩි.ඩි.ජී.සේනාධිර මයා | ✓ | | | |
| 29 | ඊ.එම්.ප්‍රේමරත්න  මයා | ✓ | | | |
| 30 | එස්.දනීෂා මිය | | ✓ | | |
| 31 | කේ.මුත්තුකුමාර් මයා | | ✓ | | |
| 32 | ඩි.එම්.පත්මිණි දිසානායක මිය | | ✓ | | |
| 33 | එච්.එම්.සිත්ති හුසෙයිමා මිය | | ✓ | | |
| 34 | ඒ.වසන්ත කුමාරන් මයා | | ✓ | | |
| 35 | එම්.එච්.ඒ.හාසීම් මයා | | ✓ | | |
| 36 | එම්.ටි.මහාරුෆ් මයා | | ✓ | | |
| 37 | එම්.ජේ.තුවාන් කාසිම් මයා | | ✓ | | |
| 38 | එම්.එස්.දිලාන් ජයතිලක මයා | | ✓ | | |
| 39 | ජී.ඒ.ඩි.අමිත අමරසූරිය මයා | | ✓ | | |
| 40 | ජයමාලි බොපගේ මිය | | ✓ | | |
| 41 | එච්.එම්.ඉන්දික සේනාරත්න මයා | | ✓ | | |
| 42 | එම්.එම්.සෝමසිරි බණ්ඩාර මයා | | ✓ | | |
| 43 | එච්.එම්.ශාන්තා ප්‍රසාදි දේශානි මිය | | ✓ | | |
| 44 | ඩබ්.එම්. කුසුමාවතී මිය | | ✓ | | |
| | එකතුව | 22 | 22 | | |

ඒ අනුව මෙම යෝජනාවට පක්ෂව ඡන්ද 22ක්ද විපක්ෂව ඡන්ද 22 ක්ද සභිකයින් විසින් ප්‍රකාශ කරන ලද අතර ඡන්ද සංඛ්‍යාව සමාන වූ බැවින් සභාපතිතුමා තීරක ඡන්දය පක්ෂව ලබා දෙන ලදි.එබැවින් සභාපතිතුමාගේ තීරක ඡන්දයෙන් ඡන්ද 23ක් පක්ෂව ලබා ගනිමින් මෙකී යෝජනාව 2025.10.30 දින සභාවේදී බහුතර ඡන්දයෙන් සභා සම්මත විය.

**6.ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද හදිසි යෝජනා.**

**හදිසි යෝජනා අංක 01**

2025.10.30 වන දින මහ සභාව වෙත ගරු සභාපති විසින් ඉදිරිපත් කරනු ලබන හදිසි යෝජනාව

වැලිමඩ ප්‍රාදේශීය සභාවට අයත් 3 කණුව කොම්පෝස්ට් අංගනය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම සම්බන්ධ යෝජනාව.

රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ කසල කළමනාකරණ වැඩසටහන යටතේ වැලිමඩ ප්‍රාදේශීය සභාවේ කොම්පෝස්ට් අංගනය ඉදිකිරීම වෙනුවෙන් වෙන් කර ඇති රු:8363634.07ක ප්‍රසම්පාදන මුදල මත එකී ව්‍යාපෘතිය 2025.12.15 දිනය වැඩ අවසන් කොට බිලිපත් අදාළ අමාත්‍යාංශය වෙත කඩිනමින් ඉදිරිපත් කළ යුතුව ඇත.

ඒ අනුව මෙකී ව්‍යාපෘතිය කඩිනමින් සිදු කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කිරීම වෙනුවෙන් වන ප්‍රසම්පාදන මණ්ඩලය සඳහා පහත සාමාජිකයින් සුදුසු බවට මම මෙම ගරු සභාව වෙත යෝජනා කරමි.

**01.අජිත් කුමාර දිසානායක මැතිතුමා -ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති -ප්‍රසම්පාද කමිටු සභාපති**
**02.ඩී.එම්.පී.එස් දිසානායක මහතා - සභා ලේකම් -කමිටු සාමාජික**
**03. කේ.යූ.පැතුම් මධුෂාන් මහතා - කාර්මික නිලධාරි - කමිටු සාමාජික**

තවද මේ සඳහා වන තාක්ෂණික ඇගයීම් කමිටුව වශයෙන් ,

**01.ආර්.එම්.ඒ. රත්නායක මහතා - ප්‍රධාන ඉංජිනේරු, පළාත් පාලන දෙපාර්තමේන්තුව - කමිටු සභාපති**
**02. එම්.එම්.ඒ.මාරසිංහ මහතා - ආදායම් අංශ ප්‍රධාන - කමිටු සාමාජික**
**03. ඩී.එම්.අයි.එස්.දිසානායක මහතා - කාර්මික නිලධාරි - කමිටු සාමාජික** යන සාමාජිකයින් සුදුසු බවටත් මම මෙම ගරු සභාව වෙත යෝජනා කර සිටිමි.

එම යෝජනාව **ගරු උප සභාපති එම්.එෆ්. සෆ්වාන් මැතිතුමා** විසින් ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්.ඉන්දික සම්පත් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, පෙර සභාපතිගෙන් ද සභාවට හදිසි යෝජනා ගෙන එන්න එපා කියල අප ඉල්ලිමක් කල අතර ඔබතුමාගෙන්ද අප සභාව ආරම්භ කල දිනයේ දිම ඉල්ලීම් කලා. ඔබතුමාත් ඊට එකග වුණා.නමුත් අද හදිසි යෝජනා මෙම සභාවට ඉදිරිපත් කරනවා. හදිසි යෝජනාවක් ඉදිරිපත් කරන විට අනුගමනය කළයුතු ක්‍රමවේදයක් රීතී තුළ සඳහන් වෙන අතර ඒම රීති පිළිබඳවත්, මෙම යෝජනාව තුළ ටෙන්ඩර් කමිටුවක් ද පත් කර තිබෙනවා.එසේ පත් කරන්නේ කෙසේද යන්න පිළිබඳවත්, පැහැදිලි කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති අජිත් කුමාර දිසානායක මැතිතුමා**

ගරු මන්ත්‍රිතුමනි,කාරක සභා අවස්ථාවකට පත් කර මේ පිළිබඳව කතා කරන ලෙස ඉල්ලා සිටිනවා.

ඒ අනුව පසුව **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අජිත් ප්‍රේමලාල් මැතිතුමා** විසින් ගරු සභාව කාරක සභා අවස්ථාවත් බවට පත් කිරිම සුදුසු බවට යෝජනා කරන ලද අතර එම යෝජනාව **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රියන්ත චාමින්ද මැතිතුමා** විසින් ස්ථිර කරන ලදි.ඒ අනුව ගරු සභාව කාරක සභා අවස්ථාවක් බවට පත්විය.

අනතුරුව **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඉන්දික රන්දෙණිය මැතිතුමා** විසින් කාරක සභා අවස්ථාව මහා සභා අවස්ථාව බවට පත් කිරිම සුදුසු බවට යෝජනා කරන ලදි .එම යෝජනාව **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් කුමාර මැතිතුමා** විසින් ස්ථිර කරන ලදි.

**ගරු සභාපති අජිත් කුමාර දිසානායක මැතිතුමා**

මෙම යෝජනා සඳහා පත් කරන ලද කමිටුවෙන් සභා ලේකම් ඉල්ලා අස්වන බවට නිවේදනය කර ඇති බැවින්,අපි මේ සඳහා කමිටුවක් පත් කර ගත යුතුය. එසේම මෙම යෝජනාව ඉදිරිපත් කරනු ලැබුයේ ඉතාමත් සත්භාවයෙන් වන අතර මෙහි වෙනත් යටි අරමුණුත් තිබෙනවා යැයි ඔබතුමන්ලා හිතනවා නම් එය වැරදි වැටහිමක් ය. මුදල් කමිටුවෙන් පත් කරගෙන ඇති ප්‍රසම්පාදන කමිටුව හෝ පත් කර ඇති කමිටුව සංශෝධනය කර ගන්නා ලෙස මා යෝජනා කර සිටිනවා.

ඒ අනුව ගරු උප සභාපති සජ්වාන් මැතිතුමා විසින් මෙම කමිටුව සංශෝධනය කිරිමට සුදුසු  බවට ස්ථිර කරන ලදි.

**ප්‍රාදේශීය  සභා මන්ත්‍රී ගරු එම්.සිසිර දිලාන් ජයතිලක මැතිතුමා**

මෙම කාරණාව පිළිබඳව ලේකම්තුමා හොඳින් කරුණු කාරණා දන්නා බැවින්,එතුමා මෙම කමිටුවෙහි සිටිය යුතුය.

එබැවින්, මෙම ප්‍රසම්පාදන කමිටුව ඒ ආකාරයෙන්ම තිබීම සුදුසු යැයි **ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී සිසිර දිලාන් මැතිතුමා**  විසින් යෝජනා කරන ලද අතර **ප්‍රාදේශීය  සභා මන්ත්‍රී ජී.ජී.ධනුෂ්ක තිලකසිරි** මහතා විසින් ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච් .එම්. කරුණාරත්න මැතිතුමා**

මෙම යෝජනාව ඉදිරිපත් කල ආකාරය පිළිබඳව සම්පත් හා ප්‍රභාත්  යන මන්ත්‍රීවරුන් විසින් අදහස් ඉදිරිපත් කරනු ලැබුවා. ඒ තුළින් අප සභාපති තුමා ඇතුළු අප පක්ෂයේ මන්ත්‍රීවරුන් පිළිබඳ වැරදි අපැහැදිලි චිත්‍රයක් මවා පෑමට උත්සාහ කරන බව පෙනී යයි.එය සම්පූර්ණයෙන්ම අප ප්‍රතික්ෂේප කරනවා.මම ඔබතුමාලගෙන් ඉල්ලා සිටින්නේ සාම්ප්‍රදායික විපක්ෂයක කෝණයකින් අප දෙස නොබලන ලෙසටයි. අපි දේශපාලන ව්‍යාපාරයක් විදිහට පෞද්ගලික පටු ලාභ අරමුණු වෙනුවෙන් දේශපාලනය කරනවා නොවෙයි.මේවා ඇතුලේ,යටි අරමුණක් ඇතුව කටයුතු කරනවා නම් නිල් පාට ,කොළ පාට දේශපාලනය අපිත් කරන බව මා පවසනවා.අවසානයේ කිසිදු ප්‍රතිලාභයක්,අරමුණක්,ප්‍රතිඵලයක්, පෞද්ගලිකව නැතිව රටට ගමට ජයග්‍රහණ අත්කර දීමට අපි සූදානම් වෙනවා.අපි ඉතිහාසය පුරා අරමුණු කළ දේශපාලනයත් එක්ක පසුගිය සැප්තැම්බර් 21 දින අපේ රටේ ජනතාව අපට සහයෝගය ලබා දුන්නා.දැන් අපේ ජනතාව ඔබතුමන්ලට ඉදිරියෙන් ඉන්නවා.

එසේම පසුගිය සභාවලදී අකටයුතුකම් සිදුවුනත් ඒ සම්බන්ධයෙන් කිසිවකු කතා කලේ නෑ.නමුත් දැන් අපේ ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාට මෙවැනි අනවශ්‍ය විවේචන චෝදනා හා ඉදිරිපත් කිරීමට උත්සාහ ගන්න එපා. අප කටයුතු කරන්නෙ අණපනත් නීතිරීති වලට පමණි. වැරැද්දක් පවතීනම් එය නිවැරදි කර ගැනීමට කටයුතු කරමු.

**ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී මන්ත්‍රී ප්‍රියන්ත චාමින්ද මැතිතුමා,**

ගරු සභාපතිතුමනි,මීට පෙර පැවති සභාවේ වංචා දූෂණ සිදු නොවුණු බව මා පවසා සිටිනවා.

**ගරු මන්ත්‍රී තුවාන් කාසිම් මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, අපි පක්ෂ පාට භේද නැතිව වැලිමඩ ප්‍රදේශයේ ජනතාවට සේවය කරන බව මා පවසා සිටිනවා.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.10.30 දින සභාවේදී ඒකමතිකව සභා  සම්මත විය.

**හදිසි යෝජනා අංක 02**

2025.10.30  වන දින මහ සභාව වෙත ගරු සභාපති විසින් ඉදිරිපත් කරනු ලබන හදිසි යෝජනාව

**වැලිමඩ ප්‍රාදේශීය සභාවට අයත් බෝගහකුඹුර වෙළඳ සංකීර්ණය අළුත්වැඩියා කිරීම සම්බන්ධ යෝජනාව.**

අප ප්‍රාදේශීය සභාවට අයත් බෝගහකුඹුර නගරයේ ඇති වෙළඳ සංකීර්ණය කඩ කාමර 14 කින් යුක්ත වන අතර එහි ඉහළ මහලේ කඩ කාමර පුළුල් කිරීමේ අවශ්‍යතාවය දැඩිව පවතී.මේ තුළින් සභාව සතු වත්කම් ආරක්ෂා කර ගනිමින් ඒවා ආදායම් උත්පාදන මාර්ග ලෙස සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවය ඉස්මතු වූ අතර වෙළඳ ප්‍රජාවගේ පහසුව සපයමින් සභාවේ කාර්යය හා කර්තව්‍ය පුළුල් කිරීම උදෙසාත්,සභා අරමුදලින් රු:586,4237.85ක මුදලක් වැය කර මෙම වෙළඳ සංකීර්ණයේ ඉහළ මහළ අළුත්වැඩියා කර පුළුල් කිරීමේ කටයුතු සිදු කිරීමත් කර්මාන්තයේ වැඩ අවසන් වූ පසු බිල්පත් පියවීමත් සුදුසු බවටත් මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එනස්ට් ඩෙන්සිල් ස්ලේඩන් මැතිතුමා** විසින් ස්ථිර කරන ලදි.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.10.30 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**හදිසි යෝජනා අංක 03**

2025.10.30 වන දින මහ සභාව වෙත ගරු සභාපති විසින් ඉදිරිපත් කරනු ලබන හදිසි යෝජනාව

**<u>යල්පත්වෙල ප්‍රදීප පෙරපාසලේ ජල බිල්පත සම්බන්ධවයි.</u>**

උක්ත කරුණට අදාල එම පෙර පාසලේ පෙර පාසල් පාලිකාව විසින් මා වෙත යොමු කර ඇති 2025.10.13 දිනැති ලිපියෙන් අංක 41/08/460/497/17 දරණ පෙර පාසලේ ජල බිල්පත රුපියල් 1000-1200 අතර , 2025.09.10 දින සිට 2025.10.10 දින දක්වා බිල්පත රුපියල් 8403.24 මුදලක් ලෙස වැඩි ඇති අතර ,මෙම මුදල වැඩි විමට හේතුව ජලනල පද්ධතිය රිලවුන් කඩා දැමීම මත ජලය අපතේ යැම හේතුවෙන් බව දන්වා ඇත.

02. නමුත්, මෙම තත්වය ඉදිරියේ ඇති නොවිමට මේවන විට ක්‍රියාමාර්ග ගෙන ඇති අතර,මෙම බිල්පත මෙම පෙරපාසලේ දරුවන්ගේ දෙමවුපියන්ට දරා ගැනිමට නොහැකි බැවින්,මෙන්ම මෙම පෙරපාසල අප ආයතනය යටතේ පාලනය වන හෙයින් මෙම බිල්පත සභා අරමුදලින් ගෙවිම කිරිමට සුදුසු බව මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව **ගරුඋප සභාපති එම්.එල්.එම්. සෆ්වාන් මැතිතුමා** විසින් ස්ථිර කරන ලදි.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.10.30 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**07.කාරක සභා වාර්තා සලකා බැලිම.**

ගරු ප්‍රාදේශිය සභා සභාපති ඩී.එම්.අජිත් කුමාර මැතිතුමා විසින් සංශෝධන ඇත්නම් ඉදිරිපත් කරන ලෙස පවසා සිටින ලදි.

ඒ අනුව,

I. 2025.10.01 වන දින නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව
II. 2025.10.14 වන දින මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව

ඉහත සඳහන් කාරක සභා වාර්තා සලකා බලන ලද අතර එකී නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට සභාව අනුමත කරන ලදි

**07. ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශන එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා හා සභාගත කළ යුතු වෙනත් ලේඛණ**

ලැබීම් හා වියදම් පිළිබඳ 2025 සැප්තැම්බර් මස මාසික ප්‍රකාශන එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තාව ගරු සභාව විසින් පිළිගන්නා ලදි.

**08. ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් හා යෝජනා**

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී තුවාන් කාසීම් මැතිතුමා**

ගරු සභාපතිතුමනි,මෙවර ටෙන්ඩර් කැඳවීමේ දි හරක් මස් කඩ සඳහා රු.1,100.00 කට තිබූ මුදල රු.2800.00 දක්වා වැඩි වෙලා තියෙනවා. මෙය කලින් කලට වෙනස් වෙන්න තියෙන ඉඩකඩ වැඩිය.ප්‍රාදේශිය සභා බලතල අනුව හරක් මස් සඳහා මිලක් නියම කරන්න පුළුවන්.මේ නිසා හරක් මස් සඳහා පාලන මිලක් දැම්ම සුදුසු බවට මා යෝජනා කර සිටිනවා .එසේම වැලිමඩ මුස්ලිම් පාසල දඹවින්න ප්‍රදේශයට ගෙන ගොස් ඇති අතර පාසලේ කැලි කසල කළමනාකරනය කිරිම මහත් ගැටළුවක් වි තිබෙනවා. කැලි කසල රැගෙන යාම සඳහා ප්‍රාදේශිය සභාවේ කසල එකතු කරන රථය කසල රථය එහි නොයන බව විදුහල්පතිතතුමා විසින් සඳහන් කරනු ලැබුවා.මේ නිසා මෙහි කැලි කසල දැම්ම කසල බඳුන් ස්ථාපිත කරන ලෙස හා සතියකට එක් දිනක් හෝ කසල එකතු කිරිම සඳහා කසල එකතු කරන රථය එහි යොදවනවානම් හොඳයැයි මා සිතනවා.මේ පිලිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.තවද පාසලේ විදුහල්පතිතුමා විසින් මේ සම්බන්ධයෙන් ලබා දුන් ලිපියද මා මේ සමඟ ඉදිරිපත් කරනවා.එසේම නැගෙනහිර හා මුලතිව් යන ප්‍රදේශවල කෙඩිට් ණය පිළිබඳ වැඩසටහන් ක්‍රියාත්මත වෙනවා.මේ නිසා එම ප්‍රදේශවල ජනතාව දැඩි පීඩනකට ලක් වි තිබෙන බව පෙනි යන කරුණකි.අප වැලිමඩ බල ප්‍රදේශයටත් මෙම තත්වය උදාවිමට ප්‍රථමව සභාව මැදිහත් වි මේ පිළිබඳව සමික්ෂණයක් කර හෝ එම අවධානම නැති කර ගැනිමට කටයුතු කිරිම සුදුසු යැයි මා සිතනවා.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.දයාරත්න මැතිතුමා ප.ව.1.55** ට සභාවෙන් පිටව යන ලදි.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ප්‍රභාත් රවින්ද්‍ර මැතිතුමා**

ගරු සභාපතිතුමනි,වැලිමඩ ප්‍රදේශයේ වැඩි වශයෙන් සිටිනුයේ ගොවි ජනතාවය.මොවුන්ගේ එළවළු අළෙවි කටයුතු කැප්පෙටිපොල ආර්ථික මධ්‍යස්ථානය කේන්ද්‍ර කර ගනිමින් සිදුකරනු ලබනවා.එළවළු මිල සම්බන්ධයෙන් ගත්විට සාධාරණ මිලක් ගොවියාට අද හිමි වන්නේ නැති අතර අඛණ්ඩව එළවළු වෙළඳපොලට එන විට ප්‍රදේශයට පිටින් පවා එළවළු රැගෙන යාම සිදු කල යුතු අතර මෙහිදි කැප්පෙටිපොල ආර්ථික මධ්‍යස්ථානය ප්‍රමුඛව කටයුතු කරනු ලබනවා. මෙහිදි දවසේ වෙළඳපල කටයුතු අවසන් කරන විට ඉතිරිවන එළවළු මිල දි ගැනිම සිදු නොවන විට කොළඹ මැනිං මාකට් ඒක ඉලක්ක කරගෙන එළවළු රැගෙන යනු ලබනවා.නමුත් පෝය දිනට මැනිං මාකට් ඒක වසා තබන බැවින්,පසුගිය කාලයේදි කැප්පෙටිපොල ආර්ථික මධ්‍යස්ථානයේ ද පෝය දිනට වෙළඳ කටයුතු සිදු වුනේ නෑ. මේ නිසා ගොවියා දැඩි අසිරුතාවයකට මුහුණ දුන්නා.එබැවින් පෙර පැවති පරිදි පෝය දිනට පෙර දිනය ආර්ථික මධ්‍යස්ථානය වසා තබන ලෙස සභාව පැත්තෙන් වැලිමඩ ගොවි ජනතාව වෙනුවෙන් ඉල්ලිම් කරන ලෙස මා ඉල්ලා සිටින අතර එසේ කිරිම තුළින් ගොවියාට ගැටළුවක් නොමැතිව එලවළු අළෙවි කර ගැනිමට හැකියාව ලැබෙනු ඇත.

තවද පසුගිය සභාවාරයේදි සංවර්ධන යෝජනා ලබා දිම සම්බන්ධයෙන් අපි කල ඉල්ලිම් කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කර සාධරණිය පිළිතුරක් ලබා දිම සම්බන්ධයෙන් මා ස්තුතිවන්ත වනවා.එසේම සමිති සමාගම්වලට බඩු භාණ්ඩ ,උපකරණ ලබාදිම අවශ්‍ය නැතිබව ඔබතුමා සඳහන් කලා.නමුත් ගමක සමිති

සමාගම් අපට උපතේ සිට මරණය දක්වාම වැදගත් වන අතර යෞවන සමාජවලටවත් මේ නිසා උපකාර කිරීමට අපට නොහැකි වී තිබෙන බැවින්,මේ කෙරෙහි නැවත සිතා බලන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් කුමාර මැතිතුමා ප.ව.2.00 ට සභාවෙන් පිටව යන ලදි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තාහීර් මහාරූෆ් මැතිතුමා**

ගරු සභාපතිතුමනි,ඔරලෝසු කණුව අසල ඉදි කිරීමට යෝජිත පැති බැම්ම සැලසුම් කර ප්ලේට් දැමීමට හැකි නම් ඉදිරියේ දී ත්‍රිරෝද රථ ගාල් කිරීමට හැකියාව ලැබෙනවා.එවිට බදුල්ල පාරේ නවතා තබනු ලබන ත්‍රි රෝද රථ මෙම ස්ථානයේ ගාල් කිරීමට හැකිය.එසේම රථවාහන ගාස්තු අය කරන පුද්ගලයින් අවිධිමත් ආකාරයට කටයුතු කරන බැවින් ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානව යොමු කරන ලෙස මා ඉල්ලා සිටින අතර වැලිමඩ නගරයේ වාහන තදබදය අවම කිරීමට කටයුතු කරන ලෙසත් මා ඉල්ලා සිටිනවා.තවද, වැලිමඩ මුස්ලිම් විද්‍යාලයේ කැලි කසල එකතු කිරීම සම්බන්ධයෙන් ද ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ඩී.ඒම්.පත්මිණී දිසානායක මැතිනිය**

ගරු සභාපතිතුමනි,සභාවක් කටයුතු කරන්නේ කෙසේද යන්න පිළිබඳවත් ,එහි රීති පිළිබඳවත් නිසි ආකාරව අපට දැන ගැනිමට ලැබුනේ පසුගිය 2025.10.28 වන දින පැවති වැඩමුළුව තුළිනි .මේ පිළිබඳව අප තාමත් ඉගෙන ගනිමින් සිටිනවා.කෙසේ නමුත් අයවැය යෝජනා තුළ මීරහවත්ත වසමට සංවර්ධන වැඩ පිළිවෙලක් දක්නට ලැබුනේ නෑ. මීරහවත්ත වසම තුළ තරුණ සේවා සමිතියක් නොමැති නිසා එය ස්ථාපිත කිරීමට අවශ්‍යයි.එසේම කාන්තාවන් සඳහා කමිටුවක් ද ස්ථාපිත කිරීමටද මා යෝජනා කර සිටිනවා.තවද ගමේ සිටින තරුණ පිරිසට,ළමුන්හට පරිගණක දැනුම ලබා දීමට අවශ්‍ය කටයුතු ලබා දීම සම්බන්ධයෙන්ද ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ශාන්තා ප්‍රසාදි මැතිනිය**

ගරු සභාපතිතුමනි,නවක අපට සභා රීති පිළිබඳව පුහුණු වැඩසටහනත් ලබා දීම සම්බන්ධයෙන් ඒ සඳහා මැදිහත් වූ ඔබතුමා ඇතුළු පිරිසට මා ස්තුති වන්ත වනවා.එසේම පිටපොල කොට්ඨාශයේ වසම් 03 ක් තිබෙන අතර අය වැය කෙටුම්පතෙහි හින්නාරංගොල්ල වසමට කිසිදු ප්‍රතිපාදනයක් වෙන් කර නෑ .මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.මෙහි දී රහංගල ප්‍රජා ශාලාව තුළ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු වනබව සඳහන් වී ඇත.මෙම ප්‍රජා ශාලාව තුළ රහංගල ග්‍රාම නිලධාරි කාර්යාල ද පිහිටා ඇති අතර එහි ඇති වැසිකිලි 02 ම භාවිතයට නුසුදුසු තත්වයක පවතිනවා.මේ නිසා සිදු කිරීමට යෝජිත ප්‍රතිසංස්කරණ කටයුත්ත තුළ මෙයට අවස්ථාවක් ලබා දීම කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.බොරලන්ද පුස්තකාලයේ සාමාජිකයින්හට කාඩ් පතක් නිකුත් කරනු ලබන්නේ නෑ .මේ නිසා දඩ අය කිරීම් ආදි කටයුතුවලින් සභාවට ලැබීමට නියමිත ආදායමක් අහිමි වීම සිදු වනවා.කාඩ් පතක් ලබා දී පරිඝණක හරහා කටයුතු කරනේ නම හොඳයැයි මා සිතනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෝමසිරි බන්ඩාර මැතිතුමා**

ගරු සභාපතිතුමනි,වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමාගේ හදිසි අභාවය පිළිබඳව ජාතික ජන බලවේගයේ ශෝකය මා මෙම අවස්ථාවේදි ප්‍රකාශ කර සිටිනවා.දිවුරුම්ගම ග්‍රාමයේ ප්‍රජාශාලාව ඇතුළු භූමිය

සභාවට පවරා ගැනීම සම්බන්ධ ලිපියක් නිලූකා මන්ත්‍රීතුමිය විසින් ඉදිරිපත් කරනු ලැබුවා.ඒ සම්බන්ධයෙන් ලබාගත් ක්‍රියා මාර්ගය පැහැදිලි කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චන්ද්‍රිකා තෙන්නකෝන් මැතිනිය**

ගරු සභාපතිතුමනි, ඔලුගංතොට විදුලි පහන් කණු අක්‍රිය වෙලා තියෙනවා.මේ පිළිබඳව සොයා බලන ලෙස මා ඉල්ලා සිටින අර අය වැය කෙටුම්පතෙහි 21,73,83,96 හා 97 යන සංවර්ධන යෝජනා ඉදිරිපත් වූ අකාරය පිලිබඳව දැන ගැනිමට අවශායි.එබැවින්,මේ පිළිබඳවත් පැහැදිලි කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති ඩී.එම්.අජිත් කුමාර දිසානායක මැතිතුමා**

ගරු මන්ත්‍රීතුමනි,මන්ත්‍රීතුමියනි, මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක් විසින් අදහස් දැක්වූවා.තුවාන් කාසිම් මන්ත්‍රීතුමා හරක් කඩ සම්බන්ධව කථා කළා.මන්ත්‍රීතුමනි,මිල පාලනය කිරීමේ හැකියාව අපට නොමැති අතර කඩ ටෙන්ඩර් කිරීමේ කටයුතු පමණක් කළ හැකි වෙනවා.එසේම මුස්ලිම් පාසලේ කසල ලබා ගැනීම සඳහා එම ආයතනය කසල එකතු කර ලබා වෙන්කර දීමට සහ කසල සඳහා බද්දක් ගෙවීමට එකඟ වන්නේ නම් කසල ලබා ගැනීමේ හැකියාව අපිට පවතිනවා.

ප්‍රභාත් මන්ත්‍රීතුමා විශේෂයෙන්ම ගොවියෝ පිළිබඳව කථා කළා,අදාළ පාර්ශවයන් ඒ පිළබඳව දැනුවත් කිරීම සඳහා ඔබතුමාගේ පැත්තෙන් යෝජනාවක් ගෙන එන ලෙස මා පවසා සිටින අතර වෙනත් කරුණු යටතේ මන්ත්‍රීවරුන් විසින් කරනු ලබන යෝජනා කල් තැබීමේ යෝජනා ලෙස ඉදිරිපත් කරන ලෙස ප්‍රකාශ කරනවා.ඒ වගේම අයවැය ප්‍රතිපාදන වෙන් කිරීම පිළිබඳව කථාකළා.අයවැයට විරුද්ධ වී ප්‍රතිපාදන වෙන් කිරීමට සතුටුවීම පිළිබඳව මා ස්තූතිවන්ත වෙනවා මන්ත්‍රීතුමනි.

තවද, මහරූෆ් මන්ත්‍රීතුමා විසින් ඔරලෝසු කණුව අසල පැති බැම්ම ඉදි කිරීම් පිළිබඳව කථා කළා.ඒ පිළිබඳව කටයුතු සිදු කිරිමේ දි ජ්ලේට් එක දැමීමට මාර්ග සංවර්ධන අධිකාරියේ අවසරය ලබා ගෙන කටයුතු කිරීමට අදාළ මැදිහත් වීම් සිදු කරන බවත්,
මීළඟට දේශානි මන්ත්‍රීතුමිය,රහංගල ප්‍රජාශාලාව පිළිබඳව ද සෝමසිරි බණ්ඩාර මන්ත්‍රීතුමා විසින් දිවුරුම්ගම ප්‍රජාශාලාව පිළිබඳව ද විමසා සිටි අතර මන්ත්‍රීතුමනි, ඒ සඳහා අවශා මැදිහත්වීම් සිදු කරමින් පවතින බවත්,
එසේම චන්ද්‍රිකා මන්ත්‍රීතුමිය විසින් අයවැය කෙටුම්පතේ සංවර්ධන යෝජනා ඉදිරිපත් වූ අකාරය විමසා සිටියා. ඔබතුමිය අයවැය යෝජනා ගැන දැන ගැනීම සඳහා ලබන සභා වාරය සඳහා කල් තැබීමේ යෝජනාවක් ඉදිරිපත් කරන ලෙසත් මා පවසා සිටිනවා..

ඒ වගේම ගරු මන්ත්‍රීතුමනි,මන්ත්‍රීතුමියනි,නව චක්‍ර ලේඛයට අනුව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව සඳහා සභාපති,උපසභාපති ඇතුළුව තවත් මන්ත්‍රීවරුන් දෙදෙනෙකුට සහභාගිවීමට අවස්ථාව ඇති බැවින් ඒ සඳහා මන්ත්‍රීවරුන් දෙදෙනෙකු පත් කර ගන්නා ලෙස මා ඉල්ලා සිටිනවා

ඒ අනුව **ගරු ඉන්දික සම්පත් මන්ත්‍රීතුමාගේ සහ ගරු තුවාන් කාසිම් මැතිතුමාගේ** යෝජනා ස්ථිරත්වයෙන් **ගරු පද්මිණී දිසානායක මන්ත්‍රීතුමියත්, ගරු ප්‍රභාත් රවීන්ද්‍ර මැතිතුමාගේ සහ ගරු අජිත් ප්‍රේමලාල් මැතිතුමාගේ** යෝජනා ස්ථිරත්වයෙන් **ගරු ප්‍රියන්ත චාමින්ද මැතිතුමා ද** ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව සඳහා පත්කර ගන්නා කරන ලදි.

ඉන් අනතුරුව ගරු සභාපතිතුමන් විසින් පැමිණ සිටි සියලු දෙනාට ස්තුති කරමින් සහභාගි වූ සියලු මන්ත්‍රීවරුන්ටත් ,කාර්ය මණ්ඩලයටත්,ව්‍යාපාරික මහතුන්ටත්,මාධ්‍යවේදී මහතුන්හට හා උපකාර කළ සියලු දෙනාට ස්තූතිය පුද කර සිටින ලදි. මීළඟ මහා සභා රැස්වීම 2025 නොවැම්බර් මස 27 වන දින පැවැත්වෙන

බවත් මුදල් හා ප්‍රතිපත්ති කමිටුවුව 2025 නොවැම්බර් මස11 වන දින පැවැත්වෙන බවත්, ගරු සභාපතිතුමා විසින් සභාවට දැනුම් දෙමින් සභාවේ වැඩ කටයුතු ප.ව 02. 35 ට පමණ නිමා කරන ලදි.

සභාපති,
ප්‍රාදේශීය සභාව,
වැලිමඩ

\

මෙම සභා වාර්තාව .................................................. වන දින පැවති මහ සභාවේ දී ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී/මන්ත්‍රීණී ......................................................................මැතිතුමා/මැතිණියගේ යෝජනාවෙන් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී/මන්ත්‍රීණී...................................................... මැතිතුමා/මැතිණියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව/බහුතර ඡන්දයෙන් සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.